SLECIC

වාර්ෂික වාර්තාව 2016
ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

අප ආයතනය 1978 අංක 15 දරණ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනත යටතේ ස්ථාපිත කරන ලද ආයතනයකි. එම පනත ආයතනය ක්‍රියාත්මක කල යුතු ක්‍රමවේදයන් පිළිබඳව මග පෙන්වීමක් ඉදිරිපත් කර තිබේ.

වාර්ෂික වාර්තාව - 2016

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (SLECIC) එම ආයතනයේ මෙහෙයුම් කටයුතු සඳහා මගපෙන්වනු ලබන්නාවූ අරමුණු සමූහයක්ද නිශ්චිතව දක්වනු ලබන්නාවූ 1978 අංක 15 දරන පනත මගින් පිහිටුවනු ලැබූ ව්‍යවසායක්වේ.

අපගේ දැක්ම

ජාත්‍යන්තර වෙළඳාම ප්‍රවර්ධනය කිරීමේ සහ සංවර්ධනය කිරීමෙහිලා උත්ප්‍රේරකයකු ලෙස ක්‍රියා කිරීම අපගේ දැක්මවේ.

අපගේ මෙහෙවර

අපනයනකරුවන්, බැංකුකරුවන්, වෙනත් මූල්‍ය ආයතන සහ ආනයනකරුවන් සඳහා තොරතුරු සැපයීමේ, සහාය ලබාදීමේ සහ ආරක්ෂාව ලබාදීමේ කටයුතුවල අප විසින් නියුක්තව සිටින්නෙමු. විශිෂ්ඨ පුද්ගල අනුබද්ධිත සේවාවන් පිරිනැමීම මගින් පාරිභෝගික අපේක්ෂාවන් අභිබවා යන පරිදි ක්‍රියා කිරීම සඳහා අප විසින් උත්සාහ දරනු ලැබේ.

වසර පහක් පිළිබඳ විශ්ලේෂණය

කාර්ය සාධන සාරාංශය (රුපියල් මිලියන වලින්)

SLECIC කාර්ය සාධන සාරාංශය 2011-2016 (රුපියල් මිලියන වලින්)	2012	2013	2014	2015	2016
රක්ෂිත ව්‍යාපාර	23,735	21,076	25,173	27,721	21,795
දළ රක්ෂණ වාරික ආදායම	174	163	195	228	179
දළ හිමිකම්පෑම්	64	32	64	80	90
මෙහෙයුම් වියදම්	114	70	121	162	183
මෙහෙයුම් අතිරික්තය	82	73	90	83	29
ආයෝජන ආදායම	91	133	100	140	160
ශුද්ධ අතිරික්තය	101	139	162	174	141
ප්‍රාග්ධනය සහ සංචිත	1,388	1,581	1,758	1978	2153
බදු සහ අයකිරීම්	73	67	29	50	53






දළ හිමිකම්පෑම
100
80
60
40
20
0
2012 2013 2014 2015 2016


මෙහෙයුම් වියදම්
200
150
100
50
0
2012 2013 2014 2015 2016


මෙහෙයුම් අතිරික්තය
100
80
60
40
20
0
2012 2013 2014 2015 2016


ආයෝජන ආදායම
200
150
100
50
0
2012 2013 2014 2015 2016


ශුද්ධ අතිරික්තය
200
150
100
50
0
2012 2013 2014 2015 2016


ප්‍රාග්ධන සහ සංචිත
2,500
2,000
1,500
1,000
500
0
2012 2013 2014 2015 2016


බදු සහ අයකිරීම්
80
60
40
20
0
2012 2013 2014 2015 2016

සභාපතිවරයාගේ සමාලෝචනය

ලෝක ආර්ථිකය

අනපේක්ෂිත අවස්ථාවන් මාලාවක් 2016 දී ගෝලීය වර්ධනය අවදානම් තත්වයකට පත් කරන ලදී. එනම් ජනවාරි මාසයේ චීනයේ කොටස් වෙළඳපොල බිඳවැටීමේ සිට වසරේ පළමු කාර්තුවේ බොරතෙල් බැරයක් ඇ.ඩොලර් 27ක් ලෙස තෙල් මිල පහත වැටීම දක්වාද, ජුනි මාසයේ බ්‍රෙක්සිට් ඡන්දය දක්වාද නැගී එන වෙළඳපලයන්හි නියුතු දේශපාලනික සිද්ධි දක්වාද, නොවැම්බර් මාසයේ එක්සත් ජනපද මැතිවරණයෙහි ප්‍රතිඵල දක්වා ද වේ. මේ සියල්ල අපේක්ෂාවන්ට අභියෝග කරන ලදී. ජනතාවාදීන්ගේ සහ ආරක්ෂණවාදීන්ගේ ඡන්දයන්හි පැන නැගීමත් සමඟ ගෝලීය වෙළඳ පරිමා වර්ධනය 2009 හි සිට එහි අවම මට්ටමට (+1.9%) ළඟා විය.

එක්සත් ජනපදය තුළ පාරිභෝගිකයන් හා සමාගම "නැවතී බලා සිටින" ක්‍රමයක වූ බැවින් ජනාධිපතිවරණයට පෙර වූ කටයුතු නතර වී පැවතුණි. ප්‍රධාන වශයෙන් පෞද්ගලික පරිභෝජන වේගය අඩු වීම, ආයෝජන වර්ධනය අඩුවීම සහ දුර්වල අපනයන ක්‍රියාකාරීත්වය යන හේතු නිසා, 2016 දී දළ දේශීය නිෂ්පාදන වර්ධනය +1.6% දී අවසන් විය යුතු විය.

අපනයන සංකෝචනයන් සිදුකරන භාණ්ඩ මිල පහත වැටීම කෙරෙහි ලතින් ඇමරිකානු රටවල් අඛණ්ඩව මුහුණ පෑ අතර එය පුළුල් වෙළඳාම හා මහජන අසමතුලිතාවන් කෙරෙහි හේතු විය. කලාපීය දළ දේශීය නිෂ්පාදනය, දෙවන අනුයාත වසරෙහි අඩුවිය. (-0.9%). ආජන්ටිනාව, බ්‍රසීලය සහ කොළොම්බියාව අති උද්ධමනයෙන් පීඩාවට පත් විය. සමාජ අසහනයෙහි බලපෑමත් සමඟ අස්ථිර රැකියා පරිසරයක් සහ දුර්වල ව්‍යාපාර වාතාවරණයක් මධ්‍යයෙහි පාරිභෝගික විශ්වාසය පහත වැටීමට ලක්විය. බ්‍රසීලය තුළ, ජනාධිපති ඩිල්මා රූසෙෆ් දෝෂාභියෝගයට පත් කිරීමෙන් පසු දේශපාලන ප්‍රශ්න පිළිබඳ මහජනතාවගේ අවිශ්වාසය මගින් මෙම තත්වය වඩාත් නරක තත්වයට පත් කරන ලදී.

එක්සත් රාජධානිය තුළ අපේක්ෂිත ප්‍රමාණයට වඩා දේශපාලන අස්ථාවරත්වය අඩු වූ බැවින් සහ මිශ්‍ර ප්‍රතිපත්ති ශීඝ්‍රයෙන් උපකාරී වී ඇති බැවින් බ්‍රෙක්සිට් කැළඹීමේ ආරම්භය කෙටිකාලීනව පැවතුණි. කෙසේ වුවද, දැඩි ස්ටර්ලිං පවුම් හිඟය යෙදවුම් පිරිවැයෙහි නැගීමටත් සහ එසේම සමාගම්හි ලාභදායීත්වයෙහි පිරිහීමටත් මූලිකවම ක්‍රියාකාරී වී තිබේ. තවදුරටත්, (අවම වශයෙන් අනුමාන ලෙස 2019 දී එක්සත් රාජධානිය ඉවත් වන තුරු) බ්‍රෙක්සිට් ඡන්දය නිසා නව ආයෝජනයන්හි සැලකිය යුතු පරිහානියක් මෙම ඉහළ අවිනිශ්චිතතාවය තුළින් ගම්‍යමාන කරයි.
යුරෝපීය කලාපය තුළ, ක්‍රියාකාරී පෞද්ගලික පරිභෝජනය සහ අවධමන පීඩනය ක්‍රමයෙන් ඉවත්වීම සහ ලාභය ඉහළ යාම යන හේතු නිසා සමාගම්හි ආයෝජන ප්‍රකෘති තත්වයට පැමිණීම මගින් 2016 දී ආර්ථිකය +1.7% දක්වා වර්ධනය වීමට එය උපකාරීවිය. ඊට අමතරව, යුරෝපීය මහ බැංකුව (ECB) 2016 දෙසැම්බර් මසදී ප්‍රකාශ කරන ලද්දේ අවම මුදලකට වුවත් 2017 වර්ෂය අවසන් වන තුරු මහ බැංකුව වත්කම් මිලදී ගන්නා බවයි. (මසකට යුරෝ බිලියන 80 වෙනුවට යුරෝ බිලියන් 60කට) අනුග්‍රාහී යුරෝපීය මහ බැංකුව එම කලාපය සඳහා සැබෑ ආරක්ෂක ජාලයක් ලෙස අඛණ්ඩව සේවය කරනු ලබයි.

ජර්මනිය තුළ ශුද්ධ අපනයනයන් සමතුලිතව පවත්වා ගෙන ගිය අතර දේශීය ඉල්ලුම අඛණ්ඩව වර්ධනයට ලක්විය. (2015 දී +1.8%) ප්‍රංශය තුළ, 2008 සිට පළමු වතාවට 2016දී ආර්ථික වර්ධනය ක්‍රමයෙන් අඩුවූ අතර 2016 දෙසැම්බර් මසදී සේවා වියුක්ති ප්‍රතිශතය අනුයාත තුන් වන මාසය දක්වාත් පහත වැටී තිබේ.

ඉතාලියේ, මන්දගාමී වර්ධනය, බැංකු ක්‍රමයේ ගැටළු, ඉහළ මට්ටමේ මහජන ණය යන කාරණා ලබා දුන් අවම සටහන් මත වර්ෂය අවසන් විය. අඛණ්ඩ දේශපාලන අස්ථාවරත්වය නොතකා ශක්තිමත් වර්ධනයක් (2016 දී +3.3%ක) මගින් ස්පාඤ්ඤයේ වර්ෂයන් සලකුණු කරන ලදී. නැගෙනහිර යුරෝපය තුළ කලාපයේ ප්‍රධාන වශයෙන් රොමේනියාව, බල්ගේරියාව, ස්ලෝවැකියාව සහ පෝලන්තය යන යුරෝපීය එකමුතුවේ සාමාජිකයන් අතර සිදුවූ තිරසාර ව්‍යාප්තිය නිසා 2016දී +1.2% දක්වා ආර්ථික වර්ධනය වේගවත් විය. ඇති වූ භූදේශපාලන ගැටළු සහ දැඩි මූල්‍යකරණ තත්වයන් තුර්කිය වෙත අභියෝග මතු කර තිබේ. 2016 දෙවන භාගය තුළ පීඩනයන් ඉවත් වුවද, තෙල් මත පදනම් වූ අභියෝග ස්වාධීන රාජ්‍යන්ගේ පොදු මඩුල්ලෙහි රටවල් අතර පවතී. රුසියාවෙහි දළ දේශීය නිෂ්පාදනය අනුයාත දෙවන වසර සඳහා ද අඩුවීමට ලක් විය. (-0.2%)

2016 වර්ෂයේදී අප්‍රිකාවේ හා මැද පෙරදිග රටවල බොහොමයක් තෙල් මිල පහත වැටීම කෙරෙහි බලපෑමට ලක් වී තිබේ. ජාතික ඉතිරි කිරීම් විශාල ප්‍රමාණයෙන් කප්පාදු වී ඇත. (සෞදි අරාබියේ 25%ක් පමණ) විනිමය අනුපාතිකය පහත වැටීමේ පීඩනයන් මැඩ පැවැත්වීම සඳහා මූල්‍ය ප්‍රතිපත්ති දැඩි කරන අතරතුර තෙල් මිල පහලයාම මධ්‍යයෙහි මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගෙන යාම අවශ්‍ය විය. තෙල් නිෂ්පාදනය කප්පාදු කිරීම සඳහා 2016 නොවැම්බර් මසදී ඔපෙක් සංවිධානය එකඟ වූ අතර කෝටාවන් මත ගිවිසුමකට ළඟාවීමට පෙර වෙළඳපල කොටස් සඳහා තරඟ කිරීමට ගල්ෆ් සහයෝගීතා මණ්ඩලයේ (GCC) සාමාජිකයන් තීරණය කරන ලදී. එවැනි ගිවිසුමක් ක්‍රියාත්මක කිරීමේදී අනුගමනය කළ යුතු පිළිවෙත තවමත් අවිනිශ්චිතය.

ආසියාව තුළ 2016දී +4.8%ක ආර්ථික වර්ධනයක් මූලික ඇස්තමේන්තු විදහා දක්වන අතර එය 2015 දී +4.9ක සිට සුළු පසුබෑමක් පෙන්නුම් කරයි. 2016 ජනවාරි මසදී සිදුවූ චීන කොටස් වෙළඳපල කඩා වැටීම මූල්‍ය අස්ථිරතාවයේ, සමාගම් ණයෙහි අතිරික්ත ස්කන්ධය (ද.දේ.නි.යෙන් 170%ක්) සහ තවදුරටත් සැලකිය යුතු අධිධාරිතාවයේ මතකයක්වේ. කෙසේ වුවද, මූල්‍යමය පැතිකඩ සම්බන්ධයෙන් සලකා බැලීමේදී මහජන සහයෝගය ශක්තිමත්ව පැවතුන අතර චීන ආර්ථික වර්ධනය 2016 දී ප්‍රකෘති තත්වයට පත්වීමක් පෙන්නුම් කරන ලදී +6.7% ඉහළ යන පෞද්ගලික පරිභෝජනය සහ හිතකාමී මිශ්‍ර ප්‍රතිපත්ති සහිතව 2016දී +1.0%ක් ලෙස දළ දේශීය නිෂ්පාදිතය වර්ධනය වීම නිසා ජපානයේ යළි නැගී සිටීම තවදුරටත් දුබල බව පෙනී යයි. ප්‍රබල ගෘහස්ථ ඉල්ලුම සහ අනුග්‍රහශීලී මූල්‍ය ප්‍රතිපත්ති මගින් රැකුලක් සැපයූ ආසියාවෙ සහ ලෝකයේ ඉහළම වර්ධනයක් වන ඉන්දියාවේ සැබෑ ද.දේ.නි. 2016 වර්ෂයේදී +7.2%ක් විය.

ශ්‍රී ලංකාවේ ආර්ථිකය

විවිධ ගෝලීය සහ දේශීය අභියෝගයන් මධ්‍යයේ 2016දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය සැබෑ අර්ථයෙන්ම සියයට 4.4කින් වර්ධනය විය. වසර පුරා පැවති අහිතකර කාලගුණික තත්වයන් ආර්ථික ක්‍රියාවන් කෙරෙහි, මූලිකවම කෘෂිකර්මාන්තය කෙරෙහි අහිතකරව බලපාන ලදී.

අපනයන කාර්ය සාධනය

දෙවන අනුයාත වර්ෂය සඳහා 2016 වර්ෂයේදී ගිවිසුම්ගත අපනයන වලින් උපචිත වන ඉපයීම් ජාත්‍යන්තර වෙළඳපල තුළ භාණ්ඩ මිල පහත වැටීමට සහ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන මධ්‍යස්ථානවල මධ්‍යස්ථ ආර්ථික පිබිදීමකට ප්‍රධාන ලෙස හේතුවී තිබේ. ප්‍රධාන වශයෙන් සම්පූර්ණ අපනයනයන්ගෙන් ආසන්න වශයෙන් හතරෙන් එකකට හේතුවන කෘෂිකාර්මික අපනයන ප්‍රමාණය අඩුවීම නිසා අපනයන ඉපයීම් පහත වැටී ඇත. කෘෂිකාර්මික නිෂ්පාදනයන් යටතේ බොහෝ

වර්ගයන්හි අඩු අපනයන ප්‍රමාණයක් නිරූපණය කරන කෘෂිකාර්මික අපනයන වලින් උපචිත වන ඉපයීම් 2016 වර්ෂයේදී එ.ජ. ඩොලර් මිලියන 2326 දක්වා සියයට 6.3කින් පහත වැටී ඇත. 2016 දී සියයට 17.7කින් පහත වැටුණු තේ අපනයන වලින් උපචිත වන ඉපයීම් 2009 සිට පහළම මට්ටම වාර්තා කරමින් 2016 වර්ෂයේදී එ.ජ. ඩොලර් මිලියන් 1269 දක්වා සියයට 5.3කින් තවදුරටත් අඩුවිය. ප්‍රධාන තේ අපනයන මධ්‍යස්ථානයන් මගින්, විශේෂයෙන්ම මැදපෙරදිග සහ රුසියාව, තෙල් මිල පහත වැටීම සහ වර්ධනය වූ භූ දේශපාලන පීඩා නිසා මෙම රටවල් විසින් අත්විඳිනු ලැබූ අඩු ආදායම් මට්ටම් වල ප්‍රතිඵලයක් වශයෙන් ඉල්ලුම පහත වැටීම නිසා ප්‍රධාන වශයෙන් තේ සඳහා වන ඉල්ලුම අඩු විය.

කුළු බඩු සහ සුළු අපනයන නිෂ්පාදන වලින් වන අපනයන ඉපයීම්හි අඩුවීම, කෘෂිකාර්මික අපනයනයන්ගෙන් වන ඉපයීම් අඩුවීම සඳහා සැලකිය යුතු ලෙස දායක වී තිබේ. ගම්මිරිස් සහ කරාබු නැටිවල අපනයන ප්‍රමාණයන් පිළිවෙලින් සියයට 50.8කින් සහ සියයට 66.6කින් සැලකිය යුතු ලෙස අඩුවීම නිසා 2015 දී වාර්තා වූ සියයට 42.7ක වර්ධනයකට එරෙහිව කුළු බඩු වලින් වන අපනයන ඉපයීම් 2016 වර්ෂයේදී එ.ජ. ඩොලර් මිලියන 317 දක්වා සියයට 16.0කින් පහත වැටී ඇත.

පොල් මද ආශ්‍රිත නිෂ්පාදන යටතේ, අඩු මුදලකට හේතු වන පොල් තෙල් අපනයනයෙන් වන ඉපයීම්හි සැලකිය යුතු පරිහානිය නොතකා, අමු පොල් ගෙඩි, පොල් කෙඳි සහ පොල් කටු, ඉරටු වැනි පොල් මද නොවන නිෂ්පාදන වැඩිවීම නිසා පොල් නිෂ්පාදන අපනයනය කිරීමෙන් උපචිත වන ඉපයීම් එ.ජ. ඩොලර් මිලියන 366 දක්වා සියයට 4.0කින් වර්ධනය වී ඇත.

රබර් අපනයන මිලෙහි වාර්තාගත පරිහානිය නොතකා, 2012 වර්ෂයේ සිට අඛණ්ඩව අඩුවීමත් පැවති, රබර් අපනයන වලින් උපචිත වන ඉපයීම්, කිලෝ ග්‍රෑම් මිලියන 16 දක්වා සියයට 55.8කින් අපනයන ප්‍රමාණයේ වර්ධනයක් නිරූපණය කරමින් 2016 වර්ෂයේ දී එ.ජ. ඩොලර් මිලියන 33 දක්වා සියයට 25.0කින් වර්ධනය වී ඇත. රබර් අත්වැසුම් සහ රබර් ටයර් වලින් වන ඉහළ ඉපයීම් වල ප්‍රතිඵලයක් වශයෙන් රබර් නිෂ්පාදන වලින් උපචිත අපනයන ඉපයීම් සියයට 0.9කින් ආන්තිකව වැඩි වී ඇත.

2015 වර්ෂයේ ජනවාරි සිට යුරෝපා සංගමය වෙත වෙළඳපල ප්‍රවේශය සම්බන්ධයෙන් සීමා පැනවීම නිසා 2015 වර්ෂයේදී සැලකිය යුතු ලෙස පහත වැටුණු මුහුදු ආහාර වලින් වන අපනයන ඉපයීම්, 2016 වර්ෂයේ ජුනි මාසයේදී ශ්‍රී ලංකාවෙන් යුරෝපා සංගමය වෙත අපනයනය කරන මුහුදු ආහාර සම්බන්ධ සීමාව ඉවත් කිරීමෙන් පසු 2016 වර්ෂයේදී එ.ජ. ඩොලර් මිලියන 170 දක්වා සියයට 4.0කින් වර්ධනය වී ඇත.

සම්පූර්ණ ඉපයීම් වලින් හතරෙන් තුනකට ආසන්න ප්‍රමාණයකට හේතු වන කාර්මික අපනයන වලින් වන ඉපයීම්, පූර්ව වර්ෂය හා සැසඳීමේදී 2016 වර්ෂයේදී එ.ජ. ඩොලර් මිලියන 7940 දක්වා සියයට 1.0කින් අඩු වී ඇත.

අර්ධ වශයෙන් සිංගප්පූරුව සහ ඉන්දියාව වැනි වෙනත් කලාපීය තරඟකරුවන්ගෙන් වන ඉහළ තරඟකාරීත්වය නිසා ප්‍රධාන ලෙස නැව් ඉන්ධන හා ගුවන් ඉන්ධන සමන්විත ඛනිජ තෙල් නිෂ්පාදනයන්ගෙන් වන අපනයන ඉපයීම් 2016 වර්ෂයේදී එ.ජ ඩොලර් මිලියන 287 දක්වා සියයට 23.3කින් පහත වැටී ඇත.

පහළ ගෝලීය ඉල්ලුමක් නිරූපණය කරමින්, පූර්ව වර්ෂය හා සන්සන්දනය කිරීමේදී මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණ වලින් වන අපනයන ඉපයීම් 2016 වර්ෂයේදී එ.ජ. ඩොලර් මිලියන 274 දක්වා සියයට 17.4කින් පහත වැටී ඇත.

සම්පූර්ණ අපනයන ඉපයීම් වලින් ආසන්න වශයෙන් සියයට 46ක ප්‍රමාණයක් වන රෙදිපිළි සහ ඇඟලුම් 2016 වර්ෂයේදී සියයට 1.3කින් වර්ධනය වී ඇත. ප්‍රමාණය සහ වටිනාකම අනුව ශ්‍රී ලාංකීය ඇඟලුම් වල විශාලතම ගැනුම්කරුවන් දෙදෙනා බවට ඇ.එ.ජ. හා යුරෝපා සංගමය අඛණ්ඩව පත්වී ඇත.

2015 වර්ෂයේ එ.ජ. ඩොලර් මිලියන 6397 දක්වා සංසන්දනය කිරීමේදී සේවාවන් අපනයනය කිරීම මගින් වන ඉපයීම් 2016 වර්ෂයේදී එ.ජ. ඩොලර් මිලියන 7,138 දක්වා සියයට 11.6කින් වර්ධනය වී තිබේ.

සංචාරක ව්‍යාපාරයෙන් වන ඉපයීම් සේවා වෙළඳාමෙහි ප්‍රධාන වර්ධක ප්‍රේරකයා වූ අතර ප්‍රවාහන සහ විදුලි සංදේශන අපනයන, පරිගණක සහ තොරතුරු සේවා ඉන්පසු වූ අපනයනවේ.

වෙළඳාමෙහි පැතිකඩ

සම්පූර්ණ අපනයන ඉපයීම් වලින් ආසන්න වශයෙන් සියයට 27.3ක ප්‍රමාණයක් සඳහා 2016 වර්ෂයේදී ප්‍රධාන අපනයන මධ්‍යස්ථානය වශයෙන් ඇමරිකා එක්සත් ජනපදය රැඳී සිටී. සම්පූර්ණ අපනයන ඉපයීම් සටහන් කරමින් එක්සත් රාජධානිය අඛණ්ඩව දෙවන විශාලතම අපනයන මධ්‍යස්ථානය බවට පත් වී තිබේ. එක්සත් රාජධානිය හැර යුරෝපා සංගමය තුළ ඇති ප්‍රධාන අපනයන මධ්‍යස්ථාන වන්නේ ජර්මනිය, ඉතාලිය, බෙල්ජියම, නෙදර්ලන්තය සහ ප්‍රංශය වේ.

හතරවන හා පස්වන විශාලතම අපනයන මධ්‍යස්ථානය වන ජර්මනියේ සහ ඉතාලියේ ප්‍රධාන අපනයන් වූයේ ඇඟලුම්, රබර් නිෂ්පාදන, තේ, ආහාර, බීම හා දුම්කොළ සහ කුළුබඩු වේ. 2016 වර්ෂයේදී රුසියාව පරදවමින් ශ්‍රී ලංකීය තේ වල ඉහළම ගැනුම්කරු ලෙස ඉරානය මතු විය. තේ සඳහා වන වෙනත් ප්‍රධාන ගැනුම්කරුවන් වන්නේ ඉරානය, තුර්කිය සහ එක්සත් අරාබි එමිරේටය වේ. මෙම රටවල් එක්ව 2016 දී තේ අපනයනයෙන් සියයට 45.2 දක්වා ඉපයීමට දායක විය.

සංචාරක ව්‍යාපාරයෙන් උපචිත ඉපයීම්

ආර්ථිකයේ ප්‍රධාන විදේශීය ව්‍යවහාර මුදල් උපයන්නකු වන ශ්‍රී ලාංකීය සංචාරක කර්මාන්තය 2016 වර්ෂය තුලදී එහි වර්ධන වේගය අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. සංචාරක ව්‍යාපාරයෙන් වන ඉපයීම් 2015 වර්ෂයේ එ.ජ. ඩොලර් මිලියන 2,981 දක්වා සැසඳීමේදී 2016 වර්ෂයේදී එ.ජ. ඩොලර් මිලියන 3518 දක්වා සියයට 18.0කින් වර්ධනය වී ඇත.

සේවකයන්ගේ ප්‍රේෂණ

සේවකයන්ගේ ප්‍රේෂණ පෙර වර්ෂයේ වූ එ.ජ. ඩොලර් මිලියන 7,007ට එරෙහිව මේ වර්ෂයේදී එ.ජ. ඩොලර් මිලිනය 7,242 දක්වා සියයට 3.7ක සාමාන්‍ය ප්‍රතිශතයකින් වර්ධනය වී ඇත. තෙල් මිල අඛණ්ඩව පහළ වැටීම සහ භූදේශපාලන අස්ථාවරත්වයේ ප්‍රතිඵලයක් වශයෙන් මැද පෙරදිග කලාපයේ රටවල ආදායම් මට්ටම පහළ වැටීම කෙරෙහි සාපේක්ෂ වශයෙන් සේවකයන්ගේ ප්‍රේෂණ පහළ යාම ආරෝපණය කළ හැකිය.

විනිමය අනුපාතිකය වෙනස්වීම

2016 වර්ෂයේ ජූනි මස 23 වන දින බ්‍රෙක්සිට් ඡන්දය අනුව යමින් සැලකිය යුතු ලෙස අගය අඩු වූ ස්ටර්ලිං පවුම් හැර සියලු ප්‍රධාන ව්‍යවහාර මුදල් වලට එරෙහිව 2016 වර්ෂයේදී රුපියලේ අගය අඩු විය. ඒ අනුව, ජාත්‍යන්තර වෙළඳපල තුල එ.ජ. ඩොලරයට එරෙහිව ජාත්‍යන්තර ව්‍යවහාර මුදල් හුවමාරුවෙහි වෙනස්වීම් නිරූපණය කිරීමේදී ස්ටර්ලින් පවුමකට එරෙහිව රුපියලෙහි අගය සියයට 16.04කින් වැඩි වූ අතර යුරෝ එකකට එරෙහිව රුපියල සියයට 0.32කින්ද, ඉන්දියානු රුපියලට එරෙහිව රුපියලෙහි අගය සියයට 1.72කින්ද, ජපයන් යෙන් එකකට එරෙහිව රුපියල සියයට 7.05කින්ද අවප්‍රමාණය වී ඇත.

SLECIC හි කාර්ය සාධනය

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (SLECIC) ණය කොන්දේසි මත විදේශීය ගැනුම්කරුවන් සමඟ වෙළඳාමෙහි යෙදෙන අතර ශ්‍රී ලාංකීය භාණ්ඩ හා සේවා අපනයකරුවන් හට පහසුකම් විශාල ප්‍රමාණයක් සපයනු ලබයි. එමනිසා, විය හැකි අවම අවධානමක් සහිතව ආරක්ෂිතව වෙළඳාම් කිරීම සඳහා SLECIC අපනයකරුවන්ට පහසුකම් සපයන අතර ඔවුන්ගේ, ණය කළමනාකරණ අවශ්‍යතා වලදී ඔවුනට සහය දෙනු ලබයි.

මූල්‍ය ප්‍රතිඵල

2015 වර්ෂයේදී ගෙවන ලද රුපියල් මිලියන 71ක වටිනාකමකින් යුත් හිමිකම් වලින් සියයට 24ක වැඩිවීමක් නිරූපණය කරමින්, රුපියල් මිලියන 88ක වටිනාකමකින් යුත් හිමිකම් ගෙවීමෙන් මේ වසර තුළ අපනයනකරුවන්ගේ බැරකම් නිදහස් කිරීමට හැකි වූ බව මා ඉතා සතුටින් දැනුම් දෙමි.

2016 දෙසැම්බර් 31 දිනට අවසන්වන වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලවල සාරාංශයක්
(රුපියල් මිලියන වලින්)

	2015	2016
දළ රක්ෂණ වාරික ආදායම	227.5	178.64
මෙහෙයුම් අතිරික්තය	83.07	29.37
ශුද්ධ හිමිකම්පෑම්	70.75	87.98
ආයෝජන ආදායම	139.20	159.90
ප්‍රාග්ධනය සහ සංචිත	1978.15	21.53.07
ශුද්ධ අතිරික්තය	174.07	141.11
බදු සහ අයකිරීම්	50.43	53.21

රක්ෂණ වාරික ආදායම



රක්ෂණ වාරික අනුපාතික ව්‍යුහය ලාභ පාඩු නොමැති ප්‍රතිපත්තිය මත පදනම් වේ. සමාලෝචනයට භාජනය වූ කාලය තුලදී සංස්ථාවේ දළ රක්ෂණ වාරික ආදායම රුපියල් මිලිනය 178.64ක ප්‍රමාණයකින් අවසන් වසර පුරා සියයට 21.48කින් අඩු කරන ලදී. ගෝලීය ආර්ථික තත්වයන්හි ප්‍රතිඵලයක් වශයෙන් 2016 දී අපනයන්හි සිදුවූ පරිහානිය මේ

සෘණාත්මක වර්ධනය සඳහා අර්ධ වශයෙන් හේතු විය. අපගේ ඇතැම් මූලික ගිණුම් ප්‍රකාශයන්ගේ සැලකිය යුතු පහත වැටීමද 2016 වර්ෂයේදී රක්ෂණ වාරික ආදායම පහත වැටීම සඳහා දායක වී ඇත.

ආයෝජන ආදායම

ආයෝජන ප්‍රමාණයේ සැලකිය යුතු අනුපාතිකයක් රජයේ සුරකුම්පත්වල යොදවනු ලැබූ අතර එම සුරකුම්පත්වල පොලී අනුපාතිකය සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුලදී පහල ඉපයීමක් අඛණ්ඩව වාර්තා කර ඇත. ආයෝජන ආදායම ප්‍රධාන වශයෙන් සමන්විත වන වෙනත් ආදායම්, රක්ෂණ වාරික ආදායමේ පහත වැටීම අවම කිරීම සඳහා විශාල ප්‍රමාණයකට කළමනාකරණය කර තිබේ. අවසන් වසරේ රුපියල් මිලියන 139.52 ක ආදායමට එරෙහිව සම්පූර්ණ ආදායමෙන් රුපියල් මිලිනය 159.90 සඳහා ගිණුම්ගත කළ 2016 වර්ෂය සඳහා වූ ආයෝජන ආදායම 2016 වර්ෂයේදී සියයට 14.6කින් වර්ධනය වී තිබේ. මෙම වර්ධනය සඳහා ප්‍රධාන හේතුව වන්නේ මේ වර්ෂය තුළ පොලී අනුපාතයන්හි සාමාන්‍ය ඉහළයාම වේ.



වෙනත් මෙහෙයුම් ආදායම්

වෙනත් මෙහෙයුම් ආදායම, අපගේ පහසුකම්, බික්ස් ඉන්ෆෝ ආදායම සහ ගෙවන ලද හිමිකම් නැවත ගෙවීම මත අය කරනු ලැබූ සියලු වර්ගයේ ගාස්තු වලින් සමන්විතවේ. එය අවසන් වසරේ රුපියල් මිලිනය 15.57ක ආදායමට එරෙහිව රුපියල් මිලියන 28.77 ක සම්පූර්ණ ආදායමක් ලෙස වාර්තා වී තිබේ. 2015 වර්ෂයේදී ලද රුපියල් මිලියන 4.79,2016 වර්ෂයේ රුපියල් මිලියන 15.29 හා සංසන්දනය කළ විට ගෙවන ලද හිමිකම් නැවත ගෙවීම පෙර වසරට වඩා සියයට 86ක සැලකිය යුතු වර්ධනයකට මූලික වී තිබේ.

හිමිකම්

විශේෂිත සහ අවිනිශ්චිත වෙන් කිරීම් වශයෙන් මුළු හිමිකම් වියදම සංඝටක දෙකකින් සමන්විතවේ. මේ වසර සඳහා වන මුළු හිමිකම් ප්‍රමාණය පෙර වර්ෂයේ රුපියල් මිලියන 70.75 සංසන්දනය කළ වට රුපියල් මිලියන 87.98කට ගණනය කර තිබේ.

මෙහෙයුම් අතිරික්තය

රක්ෂණ වාරික ආදායමේ පහත වැටීම සහ හිමිකම්හි ඉහළයාම 2016 වර්ෂයේදී මෙහෙයුම් අතිරික්තය කෙරෙහි අහිතකර ලෙස බලපා තිබේ. මෙහෙයුම් අතිරික්තය පෙර වර්ෂයේ රුපියල් මිලියන 83.07ක ප්‍රමාණය හා සංසන්දනය කළ විට මේ වර්ෂයේදී රුපියල් මිලියන 29.38කට ගණනය කර තිබේ.

රජයේ ආදායම සඳහා දායකත්වය



අභියෝගාත්මක ව්‍යාපාර තත්වයන් නොතකා, සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුලදී රජයේ ආදායම සඳහා SLECIC අඛණ්ඩව දායක වී තිබේ. අනාගත වගකීම් ආරක්ෂා කිරීම සඳහා ස්වකීය ඉපයීම්වලින් පසුගිය වසර ගණනාවක් පුරා ප්‍රමාණවත් අරමුදලක් ඇති කරන ලෙස SLECIC වෙත නියම කරනු ලැබ තිබේ. මෙම අරමුණ සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් යුතුව එම කාලසීමාවලදී නීති සම්පාදකවරුන් විසින් SLECIC ආයතනය රජය වෙත විවිධ බදු ගෙවීමෙන් නිදහස් කරන ලදී. කෙසේ වුවද වර්තමාන බදු ව්‍යුහය නිසා ඒ අනුව රජය වෙත බදු ගෙවීම සඳහා SLECIC වෙත ප්‍රකාශ කර තිබේ.

2016 වර්ෂයේදී රජයේ ආදායම සඳහා රුපියල් මිලියන 53.20කින් SLECIC දායකවී තිබේ. ඒ රක්ෂණ වාරික ආදායමේ සහ ලාභයන්හි වැටීම නොතකාය. 2016 වර්ෂයේදී වැට් බදු අනුපාතිකය ප්‍රධාන වශයෙන් 11% සිට 15% දක්වා ඉහළ යාම නිසා මූල්‍ය සේවා මත වූ වැට් බදු පෙර වර්ෂය හා සංසන්දනය කිරීමේදී තීරණාත්මක නොවන ලෙස ඉහළ ගොස් තිබේ. 2016 වර්ෂය සඳහා වාර්තා කළ ආයෝජන ආදායම්හි සැලකිය යුතු ඉහළයාමක් නිරූපණය කරමින් 2015 වර්ෂයේදී රුපියල් මිලියන 14.69ක සිට 2016 වර්ෂයේදී රුපියල් මිලියන 25.21 දක්වා ආදායම් බදු වල සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර තිබේ.

ශුද්ධ අතිරික්තය

රක්ෂණ වාරිකයෙහි සැලකිය යුතු කඩා වැටීම නොතකා, ප්‍රධාන වශයෙන් පිරිවැය පාලනය සහ ගෙවන ලද හිමිකම් නැවත ගෙවීම හා ආයෝජන ආදායම වැනි වෙනත් ආදායම් වර්ධනය කිරීම යන සාධන මත රුපියල් මිලියන 141ක මුළු ශුද්ධ ආදායමක් කරා ළඟා වීම සඳහා සංස්ථාවට හැකි වී තිබේ.

2017 වර්ෂය පිළිබඳ අපේක්ෂාව මන්දගාමීවන ලෝකය

2017 වර්ෂයේදී, ක්‍රියාකාරකම් වර්ධනය වැඩි දියුණුවිය හැකි නමුත් ඒ සඳහා වන පියවර මන්දගාමී වේ. ආර්ථික වර්ධනය +2.8%කට ළඟාවන බවට අනාවැකි පළකර තිබේ. මේ සුළු වැඩිවීම විශාල වශයෙන් එක්සත් ජනපදයේ වර්ධනය වේගය සඳහා, රුසියාවේ හා බ්‍රසීලයේ අවපාතයන් ඉවත්වීම සඳහා සහ යුරෝපය සහ ආසියාව තුළ ප්‍රතිවර්තනය සඳහා විය හැකිය.

සත්‍ය වශයෙන්ම, වෙළඳාම සහ ආයෝජන පිළිබඳ එක්සත් ජනපදය හා චීනය ඉතා ආවේගශීලී ආකල්පයක් ගත හැකි නමුත් අර්ථික වර්ධනය හා දේශපාලනය තුලනය කිරීමේදී යුරෝපය උද්යෝගීකාරයක විය හැකිය. ඉහළ නගිමින් පවතින වෙළඳපල තුළ ව්‍යාප්තිය පදනම් වූ වර්ධන වේගයක් නොමැතිකම යන කරුණ තෝරුගැනීමේ හැකියාව වැඩි කළ හැක; ඇතැම් රටවල (උදා: රුසියාව සහ ඉන්දියාව) පෞද්ගලික අංශයේ වැයකිරීම් කේන්ද්‍රීය වනු ඇත; සිදුවන ගැලපුම් මගින් (බ්‍රසීලය සහ දකුණු අප්‍රිකාව) වෙනත් රටවල ව්‍යාපාර චක්‍රය සීමා විය හැකිය; මේ අතර වෙනත් රටවල් කණ්ඩායම් පවා වර්ධනය වන අසමතුලිතාවයන්ට මුහුණ දිය හැකිය. (උදා: මෙක්සිකෝ සහ තුර්කිය) 2017 වර්ෂයේදී ද.දේ.නි. වර්ධනය +2.3%කට යොමු කරන මූල්‍ය වට්නාකමකින් එක්සත් ජනපදය ප්‍රතිලාභ ලබනු ඇත. පූර්ණ සේවා නියුක්තික කම්කරු වෙළඳපල සහ ඉහළ යන වැටුප් හා බැඳී දැඩි පාරිභෝගික විශ්වාසය මගින් 2017 වර්ෂයේදී ආර්ථිකය සුළු අධිතාපනයවීමේ අවධානමකට දිව යා හැකි බව අදහස් කරයි. මූල්‍ය දිරිගැන්වීම් මගින් උද්ධමන අපේක්ෂාවන් ඉවත් කරනු ඇති අතර මෙසේ එක්සත් ජනපදයෙහි දීර්ඝකාලීන ඉපයීම් ඉහළ යනු ඇත.

ලතින් ඇමරිකාව තුළ අවලම්බනය ධනාත්මක දේශයක් කරා මන්ගාමීව ගමන් කරනු ඇත. 2016 වර්ෂයේ ආර්ථික වර්ධනය -0.8% සිට 2017 වර්ෂයේ දී +1.4% දක්වා සහ 2018 වර්ෂයේ දී +2.3% දක්වා ගෙන එමින් ආජන්ටිනාව සහ බ්‍රසීලය ආර්ථික අවපාතයෙන් ඉවත්වීමට පටන්ගෙන තිබේ. බ්‍රසීලයේ බාහිර තත්වය විදහා දක්වා ඇති අතර උද්ධමනය එහි අරමුණු ළඟා කර ගැනීම සඳහා සකස් කර ඇත. මූල්‍ය සීමා කිරීම් නව අභියෝග ඇති කරයි. චිලීහි ආර්ථික වර්ධනය, රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ මහජනතාවගේ විරෝධය හා දුර්වල වූ විශ්වාසය මධ්‍යයේ තඹ වල මිල පහත වැටීමෙන් නැවත යථා තත්ත්වයට පැමිණ විය යුතුය.

යුරෝපීය කලාපය 2017 වර්ෂයේදී සියයට +1.7කින් වර්ධනය විය හැකි අතර බ්‍රෙක්සිට් මගින් මතුවන එහි සුපුරුදු දුෂ්කරතා රැසකට එය අඛණ්ඩව මුහුණ දෙනු ඇත. බ්‍රෙන්ට් සඳහා බොරතෙල් බැරලයක් එ.ජ. ඩොලර් 63ට අඩු, හිතකර තෙල් මිලක් පවතින අතර රැකියාවෙහි දැඩි ආයතනික වැඩ පිළිවෙලක් පවතිනු ඇත.

50 වන වගන්තිය රජය විසින් ක්‍රියාවට නැංවීම සහ යුරෝපා සංගමයෙන් ඉවත් වීම පිළිබඳ සාකච්ඡා ආරම්භ කිරීම නිසා එක්සත් රාජධානියේ අවිනිශ්චිත වාතාවරණයක් ඇති කිරීමේ හේතුවෙන් ස්ටර්ලිං පවුම් සහ නව ආයෝජන ආදායම් විශාල ගැටළු මතු කරයි. උද්ධමනය 2016 වර්ෂයේදී +0.8%ක සිට 2017 වර්ෂයේදී +2.5%ක් දක්වා ඉහළට ළඟාවීමක් අපේක්ෂා කළ හැකි අතර වැටුප් වර්ධනය (2016 වර්ෂයේදී +2.3%ක් සිට පහළට) +1.4%ක් අඩු කිරීමට සැලසුම් කර ඇත. එම නිසා, එක්සත් රාජධානියෙහි ප්‍රධාන ධාවකයා වන පෞද්ගලික පරිභෝජනය (2016 වර්ෂයේදී 3.0%ක සිට 2017 වර්ෂයේදී +1.6% දක්වා මන්දගාමී වනු ඇත.

ජර්මනිය තුළ ශුද්ධ අපනයන ඉතා තුලනාත්මකව පවතිනු ඇති අතර ගෘහස්ථ ඉල්ලුම අඛණ්ඩව ආර්ථික වර්ධනය ධාවනය කරනු ඇති බවට අපේක්ෂා කරයි. 2016 වර්ෂයේදී මහජන වියදම් හා

ආයෝජනයන්හි වර්ධන වේගයේ සහය සහිතව 2017 සහ 2018 වර්ෂවලදී ද.දේ.නි. වර්ධනය 1.7%කදී ස්ථාවර වනු ඇත.

නැගෙනහිර යුරෝපය තුළ, ද.දේ.නි. වර්ධනය යුරෝපීය සංගමයේ සාමාජික රටවල අඛණ්ඩව පැවතිය යුතුය. (2017 වර්ෂයේදී 2.8%) අවපාතයෙන් අනුයාත වසර දෙකකට පසු රුසියාවෙහි ප්‍රමාණවත් යළි නැගීමක් වනු ඇත.

නයිජීරියාව, ලිබියාව, සුඩානය, ඇන්ගෝලාව සහ ඇල්ජීරියාව වැනි ඇතැම් තෙල් අපනයන කරන ආර්ථිකයන්හි මූල්‍යමය අනාරක්ෂිත බව ඉතා දරුණු වන අතර ව්‍යවහාර මුදල් පීඩනයන් යටතේ පවතිනු ඇත. වසර තුනකට පසු භාණ්ඩ මිල වංචලවීම ඇතැම් රටවල් සකස් කළ යුතු අතර අනෙක් රටවල් ඒ සඳහා කටයුතු නොකළ යුතුය. මැද පෙරදිග තුළ, ද.දේ.නි. වර්ධනය සෞදි අරාබියේ ක්‍රියාකාරකම්හි ඇති කළ ප්‍රමාණවත් වර්ධන වේගය මගින් (2016 +1.4% සිට +1.5% දක්වා) 2017 වර්ෂයේදී +2.3%ක් දක්වා සුළු වශයෙන් වැඩි කළ යුතුය.

2016 වර්ෂය හා සැසඳීමේදී ආසියා පැසිෆික් කලාපයේ ද.දේ.නි. වර්ධනය 2017 වර්ෂයේදී දැඩි ලෙස ස්ථාවරව පැවතීම සඳහා සකස් කර ඇත. (+4.8%කට ආසන්නව) තවමත්, මෙම කලාපය ගෝලීය මට්ටමට වඩා වැඩි වේගයෙන් ද.දේ.නි. වර්ධනය අනුපාත ළගා කර ගනී.

පෞද්ගලික පරිභෝජනයන්හි සහ පහළ නිෂ්පාදන අවධමනයන්හි අඛණ්ඩ පැන නැගීම වැනි උපකාරී සාර්ව ආර්ථික ප්‍රතිපත්ති මගින් මේවා මෙහෙයවනු ලබයි. කෙසේ වුවද, ඉහළ පෞද්ගලික ණය සහ දුර්වල බැංකු වත්කම් ගුණාංග, මූල්‍ය ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ මාධ්‍යයන්ට බාධා කරන නිසා තවමත් ආර්ථික වර්ධනය යහපත් නැත. අස්ථිරතාවය වැළැක්වීම සඳහා චීනය විසින් එහි දුර්වලකම් (උදා: ණය අවධානම සහ අධිධාරිතාවය) සාකච්ඡා කරනු ලැබුවද, දැඩි මහජන සහයෝගය සහ පරික්සුම්කාරී අනුග්‍රාහක මූල්‍ය ප්‍රතිපත්ති, මේ වසරේ ආර්ථික වර්ධනය +6.3%කට ළගා කරගැනීමට උපකාරී වනු ඇත.

ස්තුතිය

වසර ගණනක් පුරා තමන් විසින් SLECIC වෙත තබන ලද අඛණ්ඩ විශ්වාසය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ අපනයන ප්‍රජාව, විශේෂයෙන්ම SLECIC හි සේවාදායකයන් සහ වාණිජ බැංකු වෙත මා විසින් ස්තුතිය පළකර සිටිමි. අප අද සිටින තත්වයට ඔබ අපව වර්ධනය කර තිබේ.

සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුලදී SLECIC හි ක්‍රියාකාරකම් හා වර්ධනය පිළිබඳ දැඩි උනන්දුවක් දැක්වීම සහ මාර්ගෝපදේශ ලබාදීම වෙනුවෙන් ගරු මුදල් අමාත්‍යවරයා වෙත මා විසින් ස්තුතිය පළකර සිටිමි. ගරු මුදල් රාජ්‍ය අමාත්‍යවරයාගේ මගපෙන්වීම සහ සහායද මා විසින් අගය කර සිටිමි.

අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් වලින් ප්‍රවීණව සහ නවීන සිතුවිලි සහිතව විවිධාකාරයෙන් අප හට අඛණ්ඩව මඟ පෙන්වන ලදී. SLECIC වෙත ඔවුන්ගේ කැපවීම සහ පරිත්‍යාගය ඉතා අගය කොට සලකමි.

SLECIC කර්තව්‍ය සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් ලබා දුන් සහයෝගය සම්බන්ධයෙන් මා විසින් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත, අතිරේක ලේකම්වරුන් වෙත සහ වෙනත් නිලධරයන් වෙත ස්තුතිය පළ කරමි. SLECIC වෙත ලබා දුන් සහාය පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ නිළධාරින් වෙත, වාණිජ දෙපාර්තමේන්තුවේ නිළධරයන් වෙත සහ බොහෝ වෙළඳ මණ්ඩලවල සාමාජිකයන් සහ නිළධරයන් වෙතද මාගේ ස්තුතිය පළ කරමි.

වර්ෂය අතරතුර අපනයන ණය රක්ෂණ කර්මාන්තයේ ශක්‍යතාව ගොඩනැගීමෙහිලා පොදු රාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලය විසින් ලබා දුන් තාක්ෂණික සහය මා විසින් අගය කර සිටිමි.

අප විසින් එසේ කිරීමට ඉල්ලා සිටි සෑම අවස්ථාවකදීම අපට නිරන්තරයෙන් සහාය ලබාදුන් බර්න් සංගම් ලේකම් කාර්යාලයේ නිලධරයන් වෙත සහ අපගේ දේශාන්තර හවුල්කරුවන් සහ වෙනත් ව්‍යාපාරික කොටස්කරුවන් වෙත මාගේ හෘදයාංගම ස්තුතිය පිරිනමනු ලැබේ. ඔවුන්ගේ අපනයන ණය රක්ෂණය පිළිබඳ තාක්ෂණික ක්ෂේත්‍රවලදී ස්වකීය දැනුම සහ සම්පත්වල සංයුක්ත කුසලතාවය SLECIC වෙත මහත් ශක්තියක් බවට පත්ව ඇත.

අපගේ කාර්ය මණ්ඩලය විසින් දක්වන ලද කැපවීම සහ උද්යෝගය සංස්ථාවට එහි සංස්ථා ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම සඳහාත් එමගින් මෙහෙයුම් අරමුණු සර්ව සම්පූර්ණව ළඟා කරගැනීම සඳහාත් හැකියාව ලබා දෙන ලදී. එම නිසා SLECIC හි සමස්ත කාර්ය මණ්ඩලය විසින් තබන ලද දැඩි විශ්වාසය හා ඔවුන්ගේ සහයෝගීතාවය මා බොහෝ අගය කොට සලකමි. එබැවින් SLECIC හි ඉලක්ක හා අරමුණු ළඟා කර ගැනීම සඳහා ඔවුන්ගේ කැපවීම සහ පරිත්‍යාගය වෙනුවෙන් SLECIC හි කාර්ය මණ්ඩලයේ සියලු සාමාජිකයන් වෙත මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි.

ඒ.එස්.එම්. මිෂ්ඛා
සභාපති සහ කළමණාකාර අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ මණ්ඩලය

ඒ. එස්. එම්. මිෂ්හා මහතා
සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ
නීතිඥ

ඒ. කේ. සෙනවිරත්න මහතා
අතිරේක ලේකම්
කර්මාන්ත සහ වාණිජ අමාත්‍යංශය

අමිලා දහනායක මහත්මිය
අධිපතිවරයාගේ ලේකම්වරයා
ශ්‍රී ලංකා මහබැංකුව

කේ. එස්. දයාරත්න මහත්මිය
සහකාර අධ්‍යක්ෂ
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යංශය

සුරේෂ් එම්. පරණවිතාන මහතා
ප්‍රධාන නිලධාරී - ජීවිත
සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

SLECICහි ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

වී.එස්.එම්. මිෂ්කා	-	*සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ*
ඩී.එච් ජේ. රණසිංහ	-	*සාමාන්‍යාධිකාරී*
ආර්.එම්.යූ.එන්. පීරිස් මිය	-	*නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී*
ධම්මික අලුත්ගේ	-	*සහකාර සාමාන්‍යාධිකාරී*
මොහාන් සිල්වා	-	*සහකාර සාමාන්‍යාධිකාරී*
මයුරි මුදලිගේ මිය	-	*සහකාර සාමාන්‍යාධිකාරී*

SLECIC නිෂ්පාදන සහ සේවා

විකුණුම්කරුගේ අවදානම සහ බැංකුකරුවන් සඳහා වූ ණය ඇපකර වශයෙන් සංකේතවත් කරන ලද අපනයන ණය රක්ෂණය මගින් රටෙහි අපනයනකරුවන්ගේ ප්‍රජාවේ සුභසිද්ධිය සඳහා SLECIC විසින් ලබාදෙන සේවාවල ප්‍රධාන කොටස සංයුක්තවේ. අවහිරයකින් සහ අපහසුතාවයකින් තොරව වාණිජ බැංකුවලින් ණය මුදල් ලබාගැනීම සඳහා වඩාත් පහසුකරමින් අපනයනකරුවන්ගේ මෙහෙයුම් කටයුතුවල විෂය පථය පුලුල් කිරීම සඳහා ඔවුන්ට හැකියාව ලබාදෙමින් අපගේ සේවා මගින් අපනයනකරුවන්ගේ මූල්‍ය සුරක්ෂිතභාවය ආරක්ෂා කරනු ලබයි.

විකුණුම්කරුගේ අවදානම

විකුණුම්කරුගේ අවදානම යනු අපනයන ප්‍රජාව වෙත ලබාදෙන අපගේ නිෂ්පාදන සහ සේවාවල මූලික පාදකය වේ. විකුණුම්කරුගේ අවදානම මගින් වාණිජ සහ දේශපාලන අවදානම් හේතුවෙන් දේශාන්තර මිලදී ගන්නා විසින් ගෙවීම් නොකිරීමේ හෝ ප්‍රමාදවී ගෙවීම් කිරීමේ අවදානමෙන් අපනයනකරු ආරක්ෂා කිරීමේ කාර්ය සඳහා කටයුතු කරනු ලබයි.

වාණිජ අවදානම් :-

- භුන්වත්භාවය සහ බංකොලොත්භාවය
- ගෙවීම් පැහැර හැරීම
- ගිවිසුම් ප්‍රතික්ෂේප කිරීම

දේශපාලන අවදානම්

- විදේශ විනිමය ප්‍රේෂණය කිරීම ප්‍රමාදකිරීම
- ආනයන බලපත්‍ර අවලංගු කිරීම
- ආනයන තහනම් කිරීම
- ගෙවීම් තාවකාලිකව තහනම් කිරීම
- යුද්ධය, විප්ලවය, කැරලි සහ ස්වභාවික විපත්

සංස්ථාව විසින් පිරිනමනු ලබන පුලුල් පරාසයක රක්ෂණ ඔප්පු අතරින්, සම්පූර්ණ පිරිවැටුම් ආවරණ රක්ෂණ ඔප්පු වඩාත් ජනප්‍රියවේ. විශේෂිත අංශවල අද්විතීය අවශ්‍යතා සඳහා සැපයීම් සිදුකිරීමට විශේෂ කාර්යයක් සඳහා සකස් කරන ලද පහසුකම්ද පවතියි.

අපනයනකරුවන් සඳහා පිරිනමන ලද අපනයන ණය රක්ෂණ ප්‍රභේද පහත දැක්වේ.

විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව - සමස්ථ පිරිවැටුම - සියලු මිලදීගන්නන්

වාණිජ අවදානම් සහ දේශපාලන අවදානම්වලින් අපනයනකරු ආරක්ෂාකිරීම සඳහා වූ රක්ෂණය මෙයින් අදහස් වේ. විලම්භනය කරන ලද ගෙවීම් නියමන් මත පවතින නැව් භාණ්ඩ තොග මේ යටතේ අප විසින් ආවරණය කරනු ලැබේ.

විකුණුම්කරුගේ රක්ෂණ ඔප්පුව - නිශ්චිත මිලදී ගන්නා

එක් හෝ වැඩි නිශ්චිත මිලදීගන්නන්ගේ වාණිජ අවදානමෙන් සහ දේශපාලන අවදානමෙන් අපනයකරු ආරක්ෂා කිරීමේ රක්ෂණය.

විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව - නිශ්චිත රට

යම් නිශ්චිත රටක මිලදීගන්නන්ගේ වාණිජ අවදානම්වලින් සහ දේශපාලන අවදානම් වලින් අපනයකරු ආරක්ෂා කිරීම සඳහා වූ රක්ෂණය

විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව - දේශපාලන අවදානම

යම් නිශ්චිත රටක දේශපාලන අවදානමෙන් අපනයකරු ආරක්ෂාකිරීම සඳහා වූ රක්ෂණය

විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව - ගෝලීය රක්ෂණ ආවරණය

ශ්‍රී ලංකාවේ පිහිටා ඇති අක්වෙරල අපනයන සමාගම් සඳහා සපයනු ලබන රක්ෂණය.

විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව - පාලිත සමාගම් අවදානම

මව් සමාගම ශ්‍රී ලංකාවේ පිහිටා ඇත්තාවූ ද වෙනත් රටක පිහිටි පාලිත සමාගමක අපනයනකරුවන්ගේ අවදානම් ආවරණය කරනු ලබන රක්ෂණය

විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව - අවසාන මිලදී ගන්නන් ආවරණය කිරීම

මිලදී ගන්නාගේ රටෙහිදී සම්පූර්ණයෙන්ම හිමිකම් දරන පාලිත සමාගමක් සඳහා නැව් භාණ්ඩ තොගය සකස්කරනු ලබන්නාවූ අවස්ථාවකදී අවසාන මිලදීගන්නන්ගේ වාණිජ සහ දේශපාලන අවදානම ආවරණය කරමින් ශ්‍රී ලාංකික අපනයනකරුවන් ආරක්ෂාකරනු ලබන රක්ෂණය

විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව - භාණ්ඩ තොග පැවරීම

භාණ්ඩ තොග පැවරීමේ වාණිජ අවදානම සහ දේශපාලන අවදානම මත ශ්‍රී ලාංකික අපනයනකරුවන් ආරක්ෂා කරනු ලබන රක්ෂණ ආවරණය

විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව - ව්‍යාපාර කේන්ද්‍ර වෙළඳාම

ව්‍යාපාර කේන්ද්‍ර වෙළඳාමෙන් උපචිතවන ශ්‍රී ලංකා අපනයනකරුවන්ගේ වාණිජ අවදානම සහ දේශපාලන අවදානම ආවරණය කරන රක්ෂණය

විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව - විකුණුම්කරුගේ අවදානම් අවබෝධතා සේවා රක්ෂණ ඔප්පුව

වාණිජ අවදානමෙන් සහ දේශපාලන අවදානමෙන් සේවා අංශයේ අපනයනකරුවන් ආරක්ෂා කරනු ලබන රක්ෂණය

විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව - දේශීය ණය රක්ෂණය

ශ්‍රී ලංකාවේ සිටින ස්වකීය මිලදීගන්නන් වෙත භාණ්ඩ භාරදීම සහ සේවා සිදුකිරීම සමග ආශ්‍රිත වාණිජ අවදානමෙන් රක්ෂණ ඔප්පු හිමියා ආරක්ෂා කරනු ලබන රක්ෂණය

බැංකු වෙත පිරිනමනු ලබන අපනයන ණය ඇපකර

අපනයනකරුවන්ගේ කල්ගතවූ පැහැර හැරීම් සහ භුන්වත්භාවය හේතුවෙන් අපනයනකරු විසින් අත්තිකාරම් මුදල් නොගෙවීම අනුව බැංකු විසින් දරනුලබන පාඩු මෙම ණය ඇපකර මගින් ලිහිල් කරනු ලබයි. බැංකු සඳහා වූ අපගේ ණය ඇපකරුවන් විසින් ඇපකර සහ ඉහල තැන්පතු ලබාදීම සඳහා වූ අවශ්‍යතාවය ඉවත් කිරීම මගින් අපනයනකරුවන්ගේ මූල්‍ය අවශ්‍යතා සඳහා පහසුකම් සලස්වනු ලබයි. අපනයනකරුවන්ගේ භුන්වත්භාවය හෝ ඔවුන්ගේ පාර්ශවයෙන් සිදුවන කල්ගතවූ පැහැරහැරීම හේතුවෙන් බැංකු විසින් දරනු ලබන පාඩුවලින් 66.66% සිට 85%ක් දක්වා ප්‍රමාණයක් ප්‍රතිපූරණය කිරීමට SLECIC ආයතනය භාරගෙන සිටිනු ලැබේ.

බැංකුවෙත පිරිනමනු ලබන අපනයන ණය ඇපකර ප්‍රභේද පහත දැක්වේ.

පූර්ව නැව්ගත කිරීම් ණය ඇපකර (තනිපුද්ගල)

තනිපුද්ගල ප්‍රතිපාර්ශව අවදානම රුපියල්වලින් සහ විදේශ ව්‍යවහාර මුදලින් 66.66% දක්වා ආවරණය කරනු ලැබිය හැකිවේ.

අමුද්‍රව්‍ය මිලදීගැනීම සඳහා, භාණ්ඩ නිෂ්පාදනය සහ සකස්කිරීම සඳහා සහ අපනයන ඇසුරුම් කිරීම සඳහා වූ ණයවර ලිපි සහ තහවුරුකිරීමේ ඇණවුම් වලට එරෙහිව අපනයනකරුවන් සඳහා

පූර්ව නැව්ගතකිරීම් පහසුකම් ප්‍රදානය කිරීම සඳහා මෙම ඇපකර මගින් මූල්‍ය ආයතන වෙත පහසුකම් සලස්වනු ලබයි.

පශ්චාත් නැව්ගතකිරීම් ණය ඇපකර (තනි පුද්ගල)

වාණිජ බැංකු වෙත මෙම ඇපකර පිරිනමනු ලබයි. අපනයන බිල්පත් මිලදී ගැනීමේ, ගණුදෙනුකිරීමේ හෝ වට්ටම් කිරීමේ මාර්ගයක් වශයෙන් පශ්චාත් නැව්ගතකිරීමේ අවස්ථාවේදී අපනයනකරුවන්ගේ වැඩ ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් මුදල් ලබාගැනීම සඳහා අපනයනකරුවන් විසින් බැංකු වෙත ප්‍රවේශවිය හැකිවීම මෙම ඇපකර මගින් සහතික කරනු ලබයි.

සම්පූර්ණ පිරිවැටුම - පූර්ව/පශ්චාත් නැව්ගතකිරීම් ණය ඇපකර

මෙම ඇපකර මගින් ඉහල ආවරණයක් සහ අඩු රක්ෂණ වාරික අනුපාතිකයක් යටතේ අපනයනකරු සඳහා හෝ වක්‍ර අපනයනකරුවකු සඳහා පූර්ව/පශ්චාත් නැව්ගතකිරීම් අත්තිකාරම් ආකාරයෙන් ප්‍රදානය කරනු ලබන සම්පූර්ණ අපනයන ණය ප්‍රමාණය ආවරණය කිරීම සඳහා බැංකු වෙත පහසුකම් සලස්වනු ලබයි.

අපනයන කාර්ය සාධන ඇපකර

ශ්‍රී ලංකාවෙන් භාණ්ඩ හා සේවා අපනයනය කිරීම සඳහා ඇතුලත්වී ඇති ගිවිසුම් යථා පරිදි ඉටුකිරීම පිළිබඳව මෙය සහතිකවන විදේශිය මිලදීගන්නන් හෝ රජයේ අධිකාරීන් වෙත ස්වකීය සේවාදායකයන් වෙනුවෙන් වාණිජ බැංකු විසින් නිකුත් කරනු ලබන ඇපකර සහ බැඳුම්කරවලට එරෙහිව වාණිජ බැංකු වෙත නිකුත් කරනු ලබන ප්‍රති ඇපකරයක්වේ. මේ සඳහා ඉදිකිරීම් වැඩ හරහා ඇගයීම් කාර්යසාධන අපනයන ගිවිසුම් ක්ෂේත්‍ර මෙන්ම භාණ්ඩ හා සේවා අපනයනය කිරීමේ ක්ෂේත්‍ර ඇතුලත්වේ.

අපනයන භාණ්ඩ ණය ඇපකර

ඇපකර පිළිබඳ වැඩි අවධාරණය කිරීමකින් තොරව අපනයනකරුවන් සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේ යෙදී සිටින නිෂ්පාදකයන් සඳහා වැඩ ප්‍රාග්ධනය සඳහා මුදල් සැපයීම සඳහා මෙම යෝජනා ක්‍රමය මගින් මූල්‍ය ආයතනය වෙත පහසුකම් සලස්වනු ලබයි.

අපනයන කාර්ය සාධන ඇපකර

මෙය ශ්‍රී ලංකාවෙන් භාණ්ඩ සහ සේවා අපනයනය කිරීම සඳහා ඇතුලත්වී ඇති ගිවිසුම් ඉටු කිරීම පිළිබඳව යථා පරිදි සහතිකවන විදේශීය මිලදී ගන්නන් හෝ රජයේ අධිකාරීන් වෙත ස්වකීය සේවාදායකයන් වෙනුවෙන් වාණිජ බැංකු විසින් නිකුත් කරනු ලබන ඇපකර සහ බැඳුම්කරවලට එරෙහිව වාණිජ බැංකු වෙත නිකුත් කරනු ලබන ප්‍රති ඇපකරයක්වේ. මේ සඳහා ඉදිකිරීම් වැඩ හරහා ඇගයීම් කාර්යසාධන අපනයන ගිවිසුම් ක්ෂේත්‍ර මෙන්ම භාණ්ඩ සහ සේවා අපනයනය කිරීමේ ක්ෂේත්‍ර ඇතුලත්වේ.

භාණ්ඩ ප්‍රවාහකයන්ගේ නිසි කාර්යසාධන ආවරණය කරනු ලබන අපනයනය

කාර්ය සාධන ණය ඇපකරය

මෙය ඇපකරය භාණ්ඩ ප්‍රවාහකයකු සඳහා ණය පහසුකම් ලබාදෙන යම් ගුවන් යානා සමාගමක් සඳහා බැංකුවක් විසින් ඇපකරයක් නිකුත්කිරීම පිළිබඳ සැලකිල්ලට ගෙන, බැංකුවක් වෙත නිකුත්කරනු ලබන ප්‍රති ඇපකරයක්වේ.

ATA කාර්නෙට් පද්ධතිය ආවරණය කරනු ලබන අපනනයන කාර්ය සාධන ඇපකර

මෙම ඇපකර, ශ්‍රී ලංකාවේ ICC වෙත ATA කාර්නෙට් ලේඛන ලබාගැනීම සඳහා අපනයනකරුවන් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය වෙත (ICC) නිකුත් කරනු ලැබේ. ATA කාර්නෙට් යනු යම් නිශ්චිත කාලසීමාවක් සඳහා යම් නිශ්චිත කාර්යයක් වෙනුවෙන් භාණ්ඩ බදුගෙවීමෙන් තොරව තාවකාලිකව ආනයනය කිරීම සඳහා අවසර දෙනු ලබන ජාත්‍යන්තර රේගු ලේඛනයක් වේ.

රැකියා සඳහා විදේශගතවන ශ්‍රී ලාංකිකයන් සඳහා සංක්‍රමණ අත්තිකාරම් පිරිවැය ආවරණය කරනු ලබන සම්පූර්ණ පිරිවැටුම් ඇපකරය "APARA"

මෙම ඇපකර යෝජනාක්‍රමය මගින් රැකියා සඳහා විදේශගතවන ශ්‍රී ලාංකිකයන් සඳහා ප්‍රදානය කරනු ලබන සම්පූර්ණ පූර්ව - පිටත්වීම් ණය මත බැංකු සඳහාවූ ආවරණයක් ප්‍රදානය කරනු ලැබේ.

වෙනත් සේවාවන්

Bizinfo - ණය සහ මූල්‍ය තොරතුරු

ශ්‍රීලාංකික අපනයනකරුවන්ගේ සහ ආනයනකරුවන්ගේ විදේශීය ගණුදෙනුකරුවන් පිළිබඳ බැංකු අංශය වෙත මේ සේවය මගින් ණය සහ තත්ත්ව වාර්තා සපයනු ලබයි. ලෝකය පුරා පවතින ප්‍රතිපත්ති ජාලකින් ණය සහ තත්ත්ව වාර්තා සපයන්නකු වශයෙන් SLECIC ආයතනය ක්‍රියාත්මකවේ.

ජාත්‍යන්තර ණය එකතුකිරීමේ සේවය

SLECIC විසින් අපනයකරුවන් වෙනුවෙන් එකතුකර නොගත් ණය අයකිරීමේ ක්‍රියාවලිය භාරගැනීම සඳහා විශ්ව ණය එකතුකිරීමේ නියෝජිත ආයතන කණ්ඩායමක් සමග හවුල්ව්‍යාපාර ගිවිසුමකට ඇතුලත්ව සිටියි. අයකරගැනීම් තක්සේරු සේවයක් මෙන්ම අයවීම් කළමණාකාරණය පිළිබඳ උපදෙස් SLECIC විසින් සපයනු ලබයි.

අපනයන ණය රක්ෂණය

ජාත්‍යන්තර වෙළඳාමේදී අවදානම් අඩුකිරීමේ උපාංගයක් වශයෙන්වූ ණය රක්ෂණ වටිනාකම මගින් නිෂ්පාදනය සඳහා ඉල්ලුම වැඩිකිරීමට හේතුවන විශ්ව පිළිගැනීමක් අත්කරගෙන ඇත.

කෙටිකාලීන ව්‍යාපාරවලදී, රක්ෂණාවරණය කරන ලද අපනයන මගින් ණය රක්ෂණ ඔප්පුවක් යටතේ ආවරණය වන අතරතුර සිදුකරන නැව්ගතකිරීම් පිරිවැටුම හෝ වටිනාකම නියෝජනය කරනු ලබයි. ආවරණය කරන ලද අපනයනයන් නිකුත්කරන ලද ණය සීමා සමග සමාන්තර නොවේ. සමාලෝචනයට භාජනයවූ වසර තුලදී, SLECIC විසින් ස්වකීය අපනයන ණය රක්ෂණය හරහා රුපියල් බිලියන විසි පහක් වටිනා අපනයන ප්‍රමාණයක් මගින් අනුබල ලබාදීමක් හරහා සියලු ආකාරයේ අපනයනකරුවන් සඳහා සහාය ලබාදී ඇත.

රක්ෂණ ව්‍යාපාරය

2015 වර්ෂයේදී අනුරූප කාලය තුලදී වූ රුපියල් බිලියන 27.7ක් සමග සංසන්දනය කර බැලීමේදී, 2016 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ කාලසීමාව සඳහා සම්පූර්ණ රක්ෂණ ව්‍යාපාරය රුපියල් බිලියන 24.5ක් දක්වා ලඟා වෙමින් සියයට 12ක පහත වැටීමක් පෙන්නුම් කරන ලදී.

රක්ෂණ ව්‍යාපාරය කාර්තුමය වශයෙන් විශ්ලේෂණය කරන විට, පළමු කාර්තු 3 තුළ 2015 වර්ෂයේ එම කාල සීමාව සමඟ සංසන්දනය කර බැලීමේදී, රක්ෂණ ව්‍යාපාරය අඩු වී ඇති බව දක්නට ලැබේ. කෙසේ වුවද හතරවන කාර්තුවේදී, 2015 වර්ෂයේ හතරවන කාර්තුව සමඟ සංසන්දනය කිරීමේදී නැවත වර්ධනය වීමේ ප්‍රවණතාවක් ලබා ගනිමින් 25%ක වර්ධනයක් වාර්තා කර ඇත.

	2015	**2016**	**වර්ධනය/පහත වැටීම**
Q1	7.9	5.7	-28%
Q2	7.2	4.9	-32%
Q3	6.9	6.8	-1%
Q4	5.7	7.1	25%
එකතුව	**27.7**	**24.5**	**-12%**



රක්ෂණ ව්‍යාපාර කලාප අනුව



අපනයන ණය රක්ෂණයේ සහාය ඇතිව අපනයනකරුවන්ට නව වෙළඳපලවලට ඇතුළුවීමට හැකියාව ලබා දෙමින් අධි අවදානම් විචල්‍ය කලාපවල රක්ෂණ ව්‍යාපාර මෑත අතීතය පුරාවට වැඩිවී ඇත.

2010 වර්ෂයේදී බටහිර යුරෝපා කලාපය විසින් 35%ක කොටසක් දරන ලද නමුත් 2016 වර්ෂයේදී ඔවුන් විසින් ආයකත්වය දරන ලද්දේ 22%ක් පමණි. පසුගිය වසර 5 තුළ SLECIC විසින් ආසියානු කලාපයේ ව්‍යාප්ත කිරීම 7% සිට 19% දක්වා වැඩිකර තිබේ.



2010 වර්ෂයේදී අප්‍රිකානු කලාපය විසින් සම්පූර්ණ රක්ෂණ ව්‍යාපාරයට 2%ක පමණක් දායකත්වය දරන ලද අතර SLECIC විසින් වැඩිවන සුරක්ෂිතතා ගැටලු සහ ආර්ථික අස්ථායිභාවය නොසළකමින් අපනයනකරුවන්ට පහසුකම් සැලැස්වීම සඳහා මෙම කලාපයේ ව්‍යාපාර වැඩි ප්‍රමාණයක වගකීම භාර ගෙන තිබේ.



විචල්‍ය අධිඅවදානම් වෙළඳපොලවල් මත SlECIC සතුව ඉතා විශාල ව්‍යාප්ත කිරීමක් පවතින අතර 2016 වර්ෂයේදී සම්පූර්ණ රක්ෂණ ව්‍යාපාරයෙන් 8%ක් ඉරානය විසින් දරනු ලබන විට බ්‍රසීලය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, රුසියාව, ලිබියාව, සෞදි අරාබිය සහ තුර්කිය විසින් පිළිවෙලින් 5%, 4%, 3%, 3%, 3%,1% වශයෙන් දරනු ලබයි. 2016 වර්ෂයේදී මේ වෙළඳපලවල් සියල්ලම විසින් SLECIC හි සම්පූර්ණ රක්ෂණ ව්‍යාපාරයෙන් 27%ක් දරනු ලැබේ.

SLECIC හි ඉහළම වෙළඳපල 20 - 2016 ජනවාරි - දෙසැම්බර්

රුපියල් බිලියන 20ක් වාර්තා කරමින් 2016 වර්ෂයේදී SLECICහි සම්පූර්ණ රක්ෂණ ව්‍යාපාරයෙන් ආසන්න වශයෙන් 83%ක් ඉහළම වෙළඳපල 20 විසින් දරනු ලැබේ.

රට	රක්ෂණ ව්‍යාපාරය රුපියල් මිලියන
ඇ.එ.ජ.	4221
ඉරානය	1901
එක්සත් රාජධානිය	1306
ජපානය	1305
බ්‍රසීලය	1155
ඕස්ට්‍රේලියාව	1090
ජර්මනිය	946
ප්‍රංශය	894
එක්සත් අරාබි එමීර් රාජ්‍යය	869
නෙදර්ලන්තය	822
රුසියාව	805
ලිබියාව	759
සිංගප්පූරුව	742
සෞදි අරාබිය	682
ඊජිප්තුව	651
චීනය	622
ස්පාඤ්ඤය	539
ඉන්දියාව	434
ඉතාලිය	356
තුර්කිය	340
වෙනත්	4091
එකතුව	**24530**

ශ්‍රී ලාංකික අපනයනකරුවන් සඳහා සහාය දැක්වීමට කලාපය තුළ පවතින දේශපාලන අස්ථාවරභාවය නොසලකා හරිමින් මැදපෙරදිග රටවල් ඇතුලුව වර්තමානයේදී SLECIC විසින් "විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව" යටතේ රටවල් 162ක දේශපාලන අවදානම ආවරණය කරනු ලබයි.

2015 වර්ෂයේදී කලාප 8ක රක්ෂණ ආවරණය බෙදා හැරීම පිළිබඳව පහත වගුවේ පෙන්නුම් කරනු ලබයි.



කලාපය	රටවල් ගණන
අප්‍රිකාව	39
ආසියාව	25
නැගෙනහිර යුරෝපය	25
බටහිර යුරෝපය	23
මධ්‍යම ඇමරිකාව	19
මැදපෙරදිග	14
උතුරු ඇමරිකාව	12
පැසිෆික් කලාපය	5
එකතුව	**162**

ණය සීමාවන්

අත්සන්කර වගකීම භාරගැනීම යනු අවදානම් මට්ටම තක්සේරු කිරීම මෙන්ම රක්ෂණ ආවරණයේ සීමාව සහ කොන්දේසි අර්ථනිරූපනය ඇතුලත් වන්නාවූ රක්ෂණ අවදානම් තක්සේරුව පිළිබඳ පරිපූර්ණ ක්‍රමවේදයක්වේ. එසේ රක්ෂණ ආවරණය අත්සන්කර භාර ගැනීමේ අරමුණ වනුයේ නියෝජිත ආයතනයේ වගකීම් භාරගැනීමේ රක්ෂණ ඔප්පුව ප්‍රකාරව අවදානම්වලට එරෙහිව (සහ කුමන කොන්දේසි යටතේ රක්ෂණය ලබාදිය හැකිද යන්න) රක්ෂණය කිරීමේ අවදානම් සහ සම්භාවිතාව හඳුනාගැනීම වේ.

රක්ෂිත පාර්ශවය ප්‍රකාරව මෙන්ම යම් නිශ්චිත ව්‍යාපෘතියක් ප්‍රකාරව අවදානම් මට්ටම හඳුනාගැනීමේ අරමුණින් වගකීම් භාර ගැනීමේ වැඩ කටයුතු පවත්වාගෙන යනු ලබන අතරතුරදී, පුළුල් පරාසයක තොරතුරු සම්පත් භාවිත කරනු ලැබේ.

විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ආවරණය නිකුත් කිරීම මගින්, මිලදීගන්නන් සහ රටවල් භාරගැනීම මගින් සහ ණයදීමට යෝග්‍ය මිලදීගන්නන් පිළිබඳ ණය සීමා නිකුත් කිරීම මගින් සංස්ථාව විසින් අපනයනකරුවන් සඳහා සහාය ලබාදීම අඛණ්ඩව සිදු කරනු ලැබේ.

ණය සීමා මගින් යම් රක්ෂණකරුවකු විසින් රක්ෂණය කිරීමට එකඟවී ඇති මුදල් ප්‍රමාණයන් නිශ්චිතව දක්වනු ලබයි. මෙම මුදල් ප්‍රමාණයන් යනු විවිධ සාධන මගින් ආභාෂය ලැබූ රක්ෂණකරු විසින් ඉදිරිපත් කරනු ලබන මිලදීගන්නන් මතවූ ණය සීමාවන් වේ.

නිකුත් කරන ලද නව ණය සීමාවන්

2016 වර්ෂයේදී, SLECIC විසින් රුපියල් බිලියන 8.9ක වටිනාකමකින් යුත් 2016 වර්ෂය තුළ නිකුත් කරන ලද නව මිලදීගන්නන්ගේ වගකීම් සීමා 460ක් නිකුත් කරනු ලැබ ඇත. එය 2015 තුළ නව මිලදීගන්නන්ගේ වගකීම් සීමා 325ක් වූ 2015 වර්ෂය සමඟ සංසන්දනය කර බලන විට 41%ක වර්ධනයකි.

	2015		2016	
	ගණන	වටිනාකම රුපියල් බිලියන	ගණන	වටිනාකම රුපියල් බිලියන
නිකුත් කරන ලද නව මිලදීගන්නන්ගේ වගකීම් සීමා	325	3.7	460	8.9
මිලදී ගන්නන්ගේ වගකීම් සීමා වැඩි දියුණු කිරීම	126	1.7	87	2.8
එකතුව	**451**	**5.4**	**547**	**11.7**



අපනයන ණය ඇපකර

SLECIC ආයතනයේ ණය ඇපකර මගින් අපනයනකරුවන් සඳහා අරමුදල් සැබෑ වශයෙන් සැපයීමට මැදිහත්වී නොසිටියි. එමගින් අපනයනකරුවන් සඳහා මුදල් සැපයීමෙන් උපචිතවන පාඩුවලට එරෙහිව අපනයන මූල්‍යකරන බැංකු ආරක්ෂා කරනු ලබයි. මූල්‍ය ආයතනය වෙත අවශ්‍ය සහාය ලබාදීම මගින්, ඔවුන් විසින් එමගින් අපනයන අංශය සඳහා මුදල් සැපයීමෙන් වඩාත් සක්‍රිය ලෙස සහභාගීවීම උනන්දු කරවනු ලැබීය. පසුගිය වසරේ මෙන්, පූර්ව නැව්ගතකිරීමේ ණය ඇපකර යෝජනා ක්‍රමය මගින් බැංකු අතර වඩාත් ජනප්‍රිය ඇපකරය අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලබයි.

ATA කාර්නෙට් පද්ධතිය ආවරණය කරන සෘජු අපනයන කාර්ය සාධන ඇපකරය

ATA කාර්නෙට් යන්නෙන් ආනයන බදු නිදහස සහ බදු නිදහස සහිතව භාණ්ඩ තාවකාලිකව ආනයනය කිරීම සඳහා අවසර දෙනු ලබන ජාත්‍යන්තර රේගු ලේඛනයක් අදහස් වන අතර වෙළඳ ප්‍රදර්ශනවලදී, ප්‍රදර්ශනවලදී සහ වෙළඳ ප්‍රවර්ධන කාර්යවලදී භාවිත කිරීම සඳහා වාණිජ සාම්පල කාර්යක්ෂම ලෙස අපනයන කරනු ලැබිය හැකි අතර යම් නිශ්චිත කාලසීමාවක් සඳහා බදු ගෙවීමෙන් තොරව ආනයනය කරන ලද වානිජ භාණ්ඩ එසේ වෙළඳප්‍රදර්ශන, ප්‍රදර්ශන සහ වෙළඳ ප්‍රවර්ධන කාර්ය වලදී භාවිත කිරීම සහ වාණිජ සාම්පල සක්‍රීය ලෙස අපනයනය කිරීම කරනු ලැබිය හැකිය.

ATA කාර්නෙට් මගින් වෙළඳ ප්‍රදර්ශනවලදී, ප්‍රදර්ශනාගාරවලදී, ප්‍රදර්ශනවලදී සහ වෙනත් එවැනි ආකාරයෙන් ඉදිරිපත් කිරීම හෝ භාවිතකිරීම සඳහා වූ වාණිජ සාම්පල, වෘත්තීයමය

උපාංග සහ භාණ්ඩ ආවරණය කරනු ලබයි. යම් අපනයනකරුවකු විසින් වාණිජ සාම්පල රටවල් අතර ප්‍රචාරය කිරීමට හෝ වෙළඳ ප්‍රදර්ශන සඳහා ප්‍රදර්ශනය කිරීමට අපේක්ෂාකර සිටියි නම්, ATA කාර්නෙට් විසින් රේගු නිශ්කාශන සහ කඩිනම් සංචාරවලදී ස්වකීය කාලය ඉතිරිකරනු ලබයි.

සම්පාර්ශවීය ඇපකරයක් නොමැතිව ATA කාර්නෙට් රේගු ලේඛනය ලබාගැනීම සඳහා අපනයකරුවන්ට, විශේෂයෙන්ම මැණික් සහ ස්වර්ණාභරන අංශය වෙත හැකියාව ලැබෙන පරිදි ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය - ශ්‍රී ලංකාව වෙත (ICC-SL) ATA කාර්නෙට් පද්ධතිය ආවරණය කරමින් සංස්ථාව විසින් සෘජු අපනයන කාර්ය සාධන ඇපකරය නිකුත් කිරීම අඛණ්ඩව සිදුකරන ලදී.

සමාලෝචනයට භාජනය වූ කාලසීමාව තුළදී, සංස්ථාව විසින් ICC-SL වෙත රුපියල් මිලියන 25.97ක් වටිනා ඉල්ලුම් ඇපක නිකුත්කර ඇත.

සංක්‍රමණ පිරිවැය - APARA

SLECIC විසින් සංක්‍රමණික සේවකයන් සඳහා සංක්‍රමණ අත්තිකාරම් පිරිවැය ආවරණය කරමින් බැංකු ඇපකර යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරනු ලබයි. මෙම බැංකු ඇපකර යෝජනා ක්‍රමය සංක්‍රමණික සේවකයන්ගේ ගුවන් ටිකට්පත් මිලදී ගැනීම සඳහා වාණිජ බැංකු විසින් ප්‍රදානය කරනු ලබන අත්තිකාරම් මුදල් ආවරණය කිරීම සඳහා 1992 මැයි මාසයේදී හඳුන්වාදෙනු ලැබූ අතර එම යෝජනා ක්‍රමය සහතික කරන ලද පාඩුවෙන් සියයට 60ක ආවරණයක් සමඟින් ක්‍රියාත්මක විය. කලින් කල, මෙම යෝජනා ක්‍රමය නම්‍යශීලී සහ සංක්‍රමණික සේවකයන්ට සහ බැංකුකරුවන්ට ලබාගත හැකි බවට පත්කිරීම සඳහා සහ 2001 වර්ෂයේදී හඳුන්වාදුන් සම්පූර්ණ පිරිවැටුම් ණය ඇපකර ලේඛන අවම කිරීම සඳහා වෙනස් කිරීම් හඳුන්වාදෙනු ලැබීය.

වර්තමානයේදී, SLECIC විසින් ණය වර්ගය පිළිබඳ නොලසකමින් සම්පූර්ණ පූර්ව පිටත්වීම් ණය මුදල් ආවරණය කරනු ලබන අතර ඇපකරවලින් තොරව මූල්‍ය ආයතනවලට සහතික කරන ලද පාඩුවෙන් ඉහළ ප්‍රතිශතයක් (සියයට 85ක්) ආවරණය කරනු ලබයි. ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ඉපයීම්වලින් සැලකිය යුතු කොටසක් සේවා නියුක්තිය සඳහා ශ්‍රී ලාංකිකයන් විදේශගත වීම මගින් දායක කරනු ලබන බැවින්, සේවාවන් අපනයනය කිරීම ඉතා ඉහළ වැදගත්කමකින් යුත් ක්ෂේත්‍රයක් වේ.

ඒ හේතුවෙන් සංක්‍රමණ පිරිවැය ආවරණය කරනු ලබන SLECIC බැංකු ඇපකරය මගින් සංක්‍රමණික සේවකයන් විසින් ස්වකීය ගුවන් ගමන සහ ඒ ආශ්‍රිත වියදම්වලට අදාළව මුහුණ දෙනු ලබන ඇතැම් සීමාකිරීම් අඩු කරනු ලබන අතර මෙම අංශය වෙත බැංකු පහසුකම් ප්‍රදානය කිරීමේදී බැංකුවල අවදානම අඩු කරනු ලබයි.

අයිතමය	2016.01.01 දිනට පිරිවැය මත/ ප්‍රත්‍යාගණනය මත වත්කම් රු.	එකතුකිරීම් 2016 රු.	බැහැර කිරීම් 2016 රු.	2016.12.30 දිනට ශුද්ධ අගය රු.	2016.01.01 දිනට ක්ෂයවීම් රු.	2016 වර්ෂයේ ක්ෂයවීම් රු.	බැහැර කිරීම් මත ක්ෂයවීම් රු.	2016.12.31 දිනට සමුච්චිත ක්ෂයවීම් රු.	2016.12.31 දිනට සඳහන් වටිනාකම (නව ප්‍රත්‍යාගණනයට පෙර) රු.	2016.12.31 දිනට ප්‍රත්‍යාගණන සංචිත (නව) රු.	2016.12.31 දිනට ප්‍රත්‍යාගණනය කළ පොත් වටිනාකම රු.
ගොඩනැගිලි	95,000,000.00	-	-	95,000,000.00	28,500,000.00	4,750,000.00	-	33,250,000.00	61,750,000.00	-	61,750,000.00
මෝටර් වාහන	18,156,575.49	-	3,125,000.00	15,031,575.49	11,068,284.49	1,803,154.00	3,124,998.00	9,746,440.49	5,285,135.00	8,114,865.00	13,400,000.00
මෘදුකාංග	6,200,449.77	472,500.00	-	6,672,949.77	5,667,651.35	227,851.77	-	5,895,503.12	777,446.65	-	777,446.65
පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර	8,480,818.21	964,999.99	-	9,445,818.20	6,731,691.21	1,253,980.00	-	7,985,671.21	1,460,146.99	2,346,853.00	3,806,999.99
ගෘහ භාණ්ඩ සහ උපකරණ	8,204,272.28	13,120.00	-	8,217,392.28	6,182,187.35	384,635.19	-	6,566,822.54	1,650,569.74	1,156,233.52	2,806,803.26
කාර්යාල උපාංග	1,522,425.87	206,385.49	-	1,728,811.36	1,336,033.87	93,109.69	-	1,429,143.56	299,667.80	575,467.69	875,135.49
මුළු එකතුව	137,564,541.62	1,657,005.48	3,125,000.00	136,096,547.10	59,485,848.27	8,512,730.65	3,124,998.00	64,873,580.92	71,222,966.18	12,193,419.21	83,416,385.39

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව
වාර්ෂික මූල්‍ය ප්‍රකාශය - 2016
2016 දෙසැම්බර් 31 දිනට සංචිත වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

	පොදු සංචිත	ප්‍රත්‍යාගණන සංචිත	ආයෝජන අරමුදල	විනිමය සමකිරීම්	තාක්ෂණික ප්‍රතියෝජන	උපයා නොගත් වාරික	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
2015 ජනවාරි 1 වන දිනට ශේෂය	1,540,640,975.06	36,940,386.35	58,507,949.05	54,803,859.53	6,644,192.04	30,391,207.86	1,727,928,569.89
ප්‍රත්‍යාගණනය සංචිතවලින් පැවරීම්	4,755,000.00	-4,755,000.00					0.00
2015 වර්ෂය සඳහා ශුද්ධ ලාභය	174,076,131.18						174,076,131.18
වසර තුළදී පැවරීම්	6,644,192.04			47,861,159.85	-6,644,192.04	-1,712,707.76	46,148,452.09
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය	1,726,116,298.28	32,185,386.35	58,507,949.05	102,665,019.38	0.00	28,678,500.10	1,948,153,153.16
ප්‍රත්‍යාගණන සංචිතයෙන් පැවරීම්	4,750,000.00	-4,750,000.00					0.00
2016 වර්ෂය සඳහා ශුද්ධ ලාභය	141,111,574.79						141,111,574.79
2016 වර්ෂය තුළදී පැවරීම්		12,193,419.21		27,044,933.31	0.00	-1,712,707.76	33,813,808.10
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	1,871,977,873.07	39,628,805.56	58,507,949.05	129,709,952.69	0.00	26,965,792.34	2,123,078,536.05

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (SLECIC) මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

සාමාන්‍ය තොරතුරු

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව 1978 අංක 15 දරන ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව පනත මගින් පිහිටුවනු ලැබූ අතර 1979 පෙබරවාරි 8 දින වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී.

මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී අදාලකරගනු ලබන මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත නිශ්චිතව දක්වා ඇත.

01. ප්‍රතිපත්ති සකස්කිරීමේ පදනම

1.1 මූලික කටයුතු සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය

අපනයන වෙළඳාමේ අවදානම් භාරගැනීම සහ අපනයන අලෙවිකරණ ක්‍රියාකාරකම්වලට අදාලව ඇපකර නිකුත් කිරීම සංස්ථාවේ මූලික කාර්ය වේ.

1.2 ගණනය කිරීමේ පදනම

2014 දෙසැම්බර් 31 දිනට සහ අවසන්වූ වර්ෂය සඳහා සංස්ථාවේ ගිණුම් ප්‍රතිපත්ති සහ නිවේදන සමගින් (මූල්‍ය ප්‍රකාශ) සංස්ථාවේ ශේෂ පත්‍රය, ආදායම් සහ වියදම් ගිණුම, සමකොටස් වෙනස්වීම සහ මූල්‍ය ප්‍රවාහයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන්නේය. මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරනු ලැබේ. පැරණි පිරිවැය පදනම මත මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලබන අතර මූල්‍ය ප්‍රකාශ සඳහා බලපාන උද්ධමන සාධක සඳහා ගැලපීම් කිරීමක් නොමැතිව එම මූල්‍ය ප්‍රකාශ නිතරම අදාලකර ගනු ලැබේ.

1.3 ඇස්තමේන්තු සහ තීන්දු භාවිත කිරීම

මූල්‍ය ප්‍රකාශ සකස්කිරීම LKAS වලට (ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට) අනුකූලවන අතර ඒ සඳහා වත්කම් සහ වගකීම්, ආදායම් සහ වියදම් පිළිබඳ ප්‍රතිප්තිත සහ වාර්තාගත මුදල් අදාලවීමට බලපානු ලබන තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන ලබාදීම සඳහා වු කළමනාකරණයක් අවශ්‍ය වන්නේ ය. අවස්ථානුගත කරුණු යටතේ සාධාරණ බවට විශ්වාස කරනු ලබන ඓතිහාසික අත්දැකීම් සහ වෙනත් විවිධ සාධක මත ඇස්තමේන්තු සහ ආශ්‍රිත උපකල්පන පදනම්වන අතර එම ඇස්තමේන්තු සහ ආශ්‍රිත උපකල්පනවල ප්‍රතිඵල, වෙනත් මූලාශ්‍රවලින් පහසුවෙන්ම වෙන්කොට දෘශ්‍යමාන වන්නාවූ වත්කම් සහ වගකීම්වල පවත්වාගෙන යන අගය මත තීරණ ගැනීමේ පදනම් සංයුක්ත වන්නේය. ඇස්තමේන්තු සහ නිශ්චිතව දක්වන ලද උපකල්පන අඛණ්ඩව ක්‍රියාත්මකවන පදනමක් යටතේ

අධීක්ෂණය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තු ප්‍රතිශෝධනයන් එම කාලසීමාව සඳහා පමණක් බලපාන්නේ නම්, ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහාවූ ප්‍රතිශෝධන එම ඇස්තමේන්තුව ප්‍රතිශෝධනය කරනු ලබන කාලසීමාව තුලදී පිළිගනු ලබන අතර එම ප්‍රතිශෝධනයක් වර්තමාන සහ අනාගත කාලසීමා සඳහා බලපාන්නේනම්, ප්‍රතිශෝධන කාලසීමාව සහ අනාගත කාලසීමාවලදී එම ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා වූ ප්‍රතිශෝධන පිළිගනු ලැබේ.

1.4 වර්තමානයේදී අඛණ්ඩව පවත්නා කටයුතු

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී, අපේක්ෂිත අනාගතයේදී අඛණ්ඩව පවත්නා කටයුත්තක් වශයෙන් පවත්වාගෙන යෑම සඳහා අප විසින් සංවිධානයේ වගකීම පිළිබඳ තක්සේරුවක් සකස් කරන ලදී. අනාගතය පිළිබඳ පවතින සියලු තොරතුරු සැලකිල්ලට ගැනීමෙන් පසුව, ඇවරකිරීමේ හෝ වෙළඳ ව්‍යාපාරය අවසන් කිරීමේ අවශ්‍යතාවයක් පිළිබඳ අපේක්ෂා නොකර සිටින්නෙමු.

02. සාපේක්ෂ තොරතුරු

සංස්ථාව විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති නිතරම අදාල කරගෙන ඇති අතර පසුගිය වසරේ භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රමිති සමග එම ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුකූල වන්නේ ය.

03. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත නිශ්චිතව දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති, මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන ලද සියලු කාලසීමා සඳහා නිතරම අදාලකරගෙන ඇති අතර සංස්ථාව විසින් නිරන්තරයෙන්ම එම ප්‍රතිපත්ති අදාලකරගෙන ඇත.

3.1 විදේශ ව්‍යවහාර මුදල් ගණුදෙනු

මූල්‍ය ප්‍රකාශවල ඇතුලත්කරන ලද අයිතම, ශ්‍රී ලංකා රුපියල් (LKR) භාවිත කරමින් ගණනය කරන ලදී. ගණුදෙනු සිදුකිරීමේ දිනවලදී පවතින අනුපාතික භාවිත කරමින් විදේශ ව්‍යවහාර ගණුදෙනු, වාර්තා කිරීමේ ව්‍යවහාරමුදල් බවට පරිවර්තනය කරනු ලැබේ. එවැනි ගණුදෙනු නිරාකරණය කිරීමෙන් උපචිතවන විදේශ විනිමය ලැබීම් සහ පාඩු ආදායම් ප්‍රකාශයේදී හඳුනාගනු ලැබේ.

ශේෂපත්‍ර දිනයේදී විදේශ ව්‍යවහාර මුදලින් විස්තර කරනු ලබන මූල්‍ය වත්කම් සහ වගකීම්, එම දිනයේදී ක්‍රියාත්මකවන විනිමය අනුපාතිකය යටතේ ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරනු ලැබේ. විදේශ ව්‍යවහාර මුදලින් විස්තර කරනු ලබන මූල්‍ය වත්කම් සහ වගකීම් පරිවර්තනය කිරීමෙන් ලැබෙන විදේශ විනිමය ලැබීම් සහ පාඩු, ශේෂ පත්‍රයේ විනිමය අනුපාතික සමකිරීමේ භාවිතයක් වෙන වෙනමම හඳුනාගනු ලැබේ.

3.2 දේපළ, යන්ත්‍රාගාර සහ උපාංග

(අ) පිළිගැනීම සහ ගණනය කිරීම

දේපළ, යන්ත්‍රාගාර සහ උපාංග, සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත ක්ෂය පාඩු අඩුකිරීමෙන් පසුව පිරිවැය/ප්‍රත්‍යාගණනය අනුව ප්‍රකාශ කරනු ලැබේ. පිරිවැය යන්නට වත්කම් අත්කර ගැනීමට සෘජුවම හේතුවන වියදම් ඇතුලත්වේ. තමා විසින්ම සකස් කරන ලද වත්කම් පිරිවැය යන්නට එම වත්කම් අපේක්ෂිත භාවිතයේ වැඩ කල හැකි තත්ත්වයට ගෙන එම සඳහා හේතුවන අමුද්‍රව්‍ය පිරිවැය, සෘජු කම්කරු සහ වෙනත් පිරිවැය සහ අයිතම කඩා බිඳ දමා ඉවත්කිරීමේ සහ එම ද්‍රව්‍ය පිහිටි පරිශ්‍රය යථාතත්ත්වයට පත්කිරීමේ පිරිවැය ඇතුලත්වේ. යම් දේපල, යන්ත්‍රාගාර සහ උපාංග අයිතමයන් සඳහා විවිධ ප්‍රයෝජනයත් අවස්ථා සහිත ප්‍රධාන උපාංග සංයුක්තවන අවස්ථාවකදී, එම අයිතම වෙනමම වූ දේපල, යන්ත්‍රාගාර සහ උපාංග අයිතම වශයෙන් සලකනු ලැබේ.

දේපල උපාංග යන්ත්‍රාගාර සහ උපාංග මිල සහිතව බැහැර කිරීමේ ප්‍රතිශ්ඨා මුදල් සමග සංසන්දනය කිරීම මගින් දේපල අයිතම, යන්ත්‍රාගාර සහ උපාංග බැහැර කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ සහ පාඩු තීරණය කරනු ලබන අතර ඒවා ආදායම් ප්‍රකාශයේ "වෙනත් මෙහෙයුම් ආදායම්" ඇතුලත පවතින ශුද්ධ ආදායම් ලෙස සලකනු ලැබේ.

(ආ) ක්ෂයවීම්

සින්නක්කර ඉඩම් හැර සියලු දේපළ, යන්ත්‍රාගාර සහ උපාංගවල ඇස්තමේන්තුගත කාලසීමා සඳහා අතිරේක අගය සඳහා වූ පිරිවැය සහ ප්‍රත්‍යාගණන මුදල් වෙන්කිරීමේ සෘජු රේඛීය ක්‍රමයක් භාවිත කරමින් ක්ෂයවීම් සඳහා වෙන්කිරීම් ගණනය කරනු ලැබේ.

භාවිතා කරන ලද ප්‍රධාන වාර්ෂික අනුපාතික පහත දැක්වේ.

1. ගොඩනැගිලි 5%
2. කාර්යාල උපාංග 25%
3. මෝටර් වාහන 20%
4. ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් 10%

එම වත්කම් මතවූ අපේක්ෂිත ඓතිහාසික පිරිවැය ක්ෂයවීම් ගාස්තුව සම්බන්ධයෙන්වූ ප්‍රත්‍යාගණන වත්කම් මත වූ වාර්ෂික ක්ෂයවීම් ගාස්තුවට වැඩි මුදල් ප්‍රමානයට සමානවූ මුදලක්, සමුච්චිත ලාභය සඳහා වූ ප්‍රත්‍යාගනයේ අතිරික්තයෙන් වාර්ෂිකව පවරනු ලැබේ. මුදලක් සහිතවන වත්කම් එහි ඇස්තමේන්තුගත අයකලහැකි මුදලට වඩා වැඩිවේ නම්, මුදලක් සහිත වත්කම් එහි අයකල හැකි මුදල දක්වා වහාම අඩුකරනු ලැබේ.

(ඈ) **බැහැර කිරීම**

මුදලක් දරනු ලබන ප්‍රතිශ්ඨා මුදල් සමග සංසන්දනය කිරීම මගින් බැහැර කිරීම් මතවූ ලැබීම් සහ පාඩු තීරණය කරනු ලබන අතර ආදායම් ප්‍රකාශයේ මෙහෙයුම් ලාභ සහ පාඩු තීරණය කිරීමේදී එම ලැබීම් සහ පාඩු පිළිගනු ලැබේ. ප්‍රත්‍යාගණන වත්කම් විකුණනු ලබන අවස්ථාවකදී, ප්‍රත්‍යාගණන සංචිතයේ ඇතුලත්කරන ලද මුදල, රඳවා තබා ගනු ලැබූ ඉපයුම් වෙත පවරනු ලැබේ.

(ඈ) **දුබල කිරීම**

වාර්ෂිකව හෝ දුබල වීම සම්බන්ධයෙන් හෝ අවස්ථානුගත සිදුවීම් හෝ වෙනස්වීම් අනුව දරනු ලබන වටිනාකම අයකරගත නොහැකිවන අවස්ථාවකදී, දුබලවීම සම්බන්ධයෙන් වූ දේපලෙහි, යන්ත්‍රාගාරයේ සහ උපාංගයේ දරා සිටින අගය අධීක්ෂණය කරනු ලැබේ. එවැනි දර්ශකයන් පවතී නම් සහ දරනු ලබන අගය, ඇස්තමේන්තුගත අයකරගත හැකි මුදල ඉක්මවා යන්නේ නම්, එහි අයකල හැකි වටිනාකම සඳහා වත්කම් අගය අඩුකරනු ලැබේ. එම වත්කම් සඳහාම පූර්ව ප්‍රත්‍යාගණන ඉතිරියක් එමගින් වෙන්කර දේ නම් මිස, වටිනාකම් අඩුවීමේ පාඩු ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබිය හැකිවේ.

(ඉ) **දේපළ, යන්ත්‍රාගාර සහ උපාංග විකිණීමෙන් ලැබන ලාභ/පාඩු**

දේපල, යන්ත්‍රාගාර සහ උපාංග ඉවත්කිරීම හෝ බැහැර කිරීම මතවූ ලැබීම් හෝ පාඩු, විකිනීම් සිදුවන කාලයේදී පිළිගනු ලබන අතර වෙනත් පරිපූර්ණ ආදායමක් වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ.

3.4 ප්‍රාග්ධන වැඩකටයුතුවල ප්‍රගතිය

ශේෂ පත්‍රයේ දිනයේදී සම්පූර්ණකර නොමැති වර්ෂය තුලදී දරන ලද ප්‍රාග්ධන වියදම්, අත්තිකාරම් ගෙවීම් වශයෙන් පෙන්වා ඇති අතර වර්ෂය තුලදී සම්පූර්ණකර ඇති සහ භාවිත කිරීමට යොදවා ඇති ප්‍රාග්ධන වත්කම්, දේපල, යන්ත්‍රාගාර සහ උපකරන වලට මාරුකර ඇත.

3.5 ස්පර්ශකල නොහැකි වත්කම්

වැදගත් ප්‍රයෝජන සහිත කාලසීමා සහිත සමාගම විසින් අත්කරගනු ලබන ස්පර්ශකල නොහැකි වත්කම් සමුච්චිත ණය හිලව් කිරීමෙන් සහ සමුච්චිත පාඩු අඩු කිරීමෙන් පසුව පවතින පිරිවැය යටතේ ගණනය කරනු ලැබේ. පරිගණක මෘදුකාංග වැඩසටහන් සමග ආශ්‍රිත පිරිවැය, දරන ලද වියදමක් වශයෙන් පිළිගනු ලැබේ. සංස්ථාව විසින් ක්‍රියාත්මක කරනු ලබන සහ පාලනය කරනු ලබන හඳුනාගත හැකි සහ අද්විතීය මෘදුකාංග නිෂ්පාදන සැලසුම් කිරීමට හා පරීක්ෂා කිරීමට සෘජුවම අදාලවන සංවර්ධන පිරිවැය, ස්පර්ශකල නොහැකි වත්කම් වශයෙන් පිළිගනු ලැබේ.

(අ) පිළිගැනීමේ පදනම

වත්කම්වලට අදාල අනාගත ආර්ථික ප්‍රතිලාභ සමස්ථය සඳහා ගලා යන්නේ නම් සහ පිරිවැය විශ්වසනීය ලෙස ගණනය කල හැකිනම් සහ සමුච්චිත ණය හිලව් කිරීම් අඩු කිරීමෙන් සහ සමුච්චිත ක්ෂයවීම් පාඩු අඩුකිරීමෙන් පසුව එම සමස්ථය පවත්වාගෙන හැකිනම්, යම් ස්පර්ශකල නොහැකි වත්කමක් පිළිගනු ලැබිය හැකිවේ.

(ආ) පශ්චාත් වියදම්

පශ්චාත් වියදම් අදාලවන නිශ්චිත වත්කම්වල ඇතුලත් කරන ලද අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩිවන අවස්ථාවලදී පමණක් පශ්චාත් වියදම් ප්‍රයෝජනයට ගනු ලැබේ. අභ්‍යන්තරව උත්පාදනය වූ කීර්තිනාමය සහ වෙළඳලකුනු මතවූ වියදම් ඇතුලුව වෙනත් සියලු වියදම්, ආදායම් ප්‍රකාශයේ සඳහන් දරන ලද වියදම් වශයෙන් පිළිගනු ලැබේ.

(ඇ) ඉවත්කිරීම සහ බැහැර කිරීම

බැහැර කිරීමේදී හෝ එම වත්කම් භාවිතයේදී සහ පශ්චාත් බැහැර කිරීම් වලින් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන අවස්ථාවකදී යම් ස්පර්ශකල නොහැකි වත්කමක් පිළිගනු ලැබේ.

(ඈ) ණය හිලව් කිරීම

ණය හිලව් කිරීම භාවිතය සඳහා පවතින දින සිට, ස්පර්ශකල නොහැකි වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් කාලය තුලදී සෘජු රේඛීය පදනමක් මතවූ ආදායම් ප්‍රකාශයේ, ණය හිලව් කිරීම් හඳුනාගනු ලැබේ.

(ඉ) දුබල කිරීම

යම් දුබලවීම් ප්‍රදර්ශනයවීමක් පවතීද යන්න තීරණය කිරීම සඳහා එක් එක් ශේෂ පත්‍රයේ සඳහන් සංස්ථාවේ වත්කම්වල දරනු ලබන මුදල් අධීක්ෂණය කරනු ලැබේ. එවැනි ප්‍රදර්ශනයවීමක් පවතීනම්, වත්කම්වල අයකල හැකි මුදල ඇස්තමේන්තු කරනු ලැබේ. යම් වත්කමක දරන මුදල හෝ එහි මුදල් උපචිතවන ඒකකය, එහි අයකල හැකි මුදල් ප්‍රමාණය ඉක්මවා යන්නේ නම් දුබලවීමේ පාඩුවක් පිළිගනු ලැබේ. දුලබවීමේ පාඩුව ආදායම් ප්‍රකාශය මගින් පිළිගනු ලැබේ.

3.6 ආයෝජන දේපල

දීර්ඝකාලීන ඉපයීම් සඳහා හෝ ප්‍රාග්ධන ඉහලයාම් සඳහාදරන ලද දේපල ආයේජන දේපළ වශයෙන් වර්ගීකරණ්‍ය කරනු ලැබේ. ආරම්භක පිළිගැනීමෙන් පසුව, ආයෝජන දේපල යම් පිරිවැයක් යටතේ පවත්වාගෙන යනු ලැබේ.

3.7 කෙටි කාලීන ආයෝජන

(අ) දේශීය ව්‍යවහාර මුදලින් පවතින කෙටිකාලීන ආයෝජන

සංස්ථාව විසින් රජයේ භාණ්ඩාගාර බිල්පත්වල සහ වෙනත් ස්ථාවර ආදායම් ආයෝජනවල කෙටිකාලීන අතිරික්ත අරමුදල් පිහිටුවා ඇති අතර ශේෂ පත්‍ර දිනයේදී පවතින විනිමය අනුපාතිකය යටතේ තක්සේරු කරන ලද විදේශ ව්‍යවහාර මුදලින් පවත්වාගෙන යන ස්ථාවර තැන්පතු සඳහා හැර, පිරිවැය යටතේ එම මුදල් ගිණුම්කරණය කරන ලදී. මෙම ආයෝජන මත උපචිතවන පොලිය ආදායම් ප්‍රකාශයේ පිළිගෙන ඇත.

(ආ) විදේශ ව්‍යවහාර මුදලින් පවතින කෙටිකාලීන ආයෝජන

විදේශ ව්‍යවහාර මුදලින් පවතින අනාගත හිමිකම් වගකීම් සපුරාලීම සඳහා අවශ්‍යවන අරමුදල් වෙන් කොට තබා පොලිය උපචිතවන විදේශ ව්‍යවහාර ගිණුමේ තැන්පත් කර ඇත. උපචිතවූ පොලිය, පරිවර්තන දිනයේදී පැවති අනුපාතිකය යටතේ පරිවර්තනය කරන ලද ආදායම් ප්‍රකාශයේ පිළිගෙන ඇත. මූල්‍ය ප්‍රකාශයේ පිළිගෙන ඇති ආයෝජනවල වටිනාකම ශේෂපත්‍ර දිනයේදී පවතින අනුපාතිකය යටතේ පරිවර්තනය කරනු ලැබේ.

3.7.1 මූල්‍ය සාධනපත්‍රවලින් උපචිතවන අවදානම

කෙටිකාලීන සහ දීර්ඝ කාලීන ආයෝජන සඳහා භාණ්ඩාගාර බිල්පත්වල, භාණ්ඩාගාර බැඳුම්කරවල, රජයේ බැංකු ස්ථාවර තැන්පතුවල සහ ඍණපත්‍රවල සිදුකරන ලද ආයෝජන සමන්විතවේ. ඍණ පත්‍ර සඳහා පොලී අනුපාතික අවදානම, ප්‍රති ආයෝජන අවදානම, පැහැර හැරීමේ අවදානම, සහ ඇවරකිරීමේ අවදානම දරනු ලැබේ. ස්ථාවර තැන්පතු කල්පිරීම දක්වා දරනු ලබන බැවින්, දේශීය ව්‍යවහාර මුදල් ස්ථාවර තැන්පතු සඳහා පවතින වෙනත් අවදානම්වලට අමතරව, ව්‍යවහාර මුදල් උච්චාවචනයවීම් අවදානම සඳහා විවෘතව පවතින විදේශ ව්‍යවහාර මුදලින් පවතින ස්ථාවර තැන්පතු සඳහා හැර, එමගින් පැහැර හැරීම් සහ ඇවරකිරීම් අවදානම් පමණක් දරනු ලැබේ.

3.8 වෙළඳ සහ වෙනත් ලැබීම්

වෙළඳ සහ වෙනත් ලැබීම්, නිශ්කාශනය වීමට නියමිත ඇස්තමේන්තුගත මුදල සඳහා ප්‍රකාශකර ඇත. වසර තුනකට වැඩි කාලයක් සඳහා හිඟව පවතින බොල් ණය සහ අවිනිශ්චිත ණය සඳහා මූල්‍ය ප්‍රකාශවල වෙන් කිරීම් ලබාදී ඇත.

3.9 භාණ්ඩ ලැයිස්තු

භාණ්ඩ ලැයිස්තු සඳහා ලිපිද්‍රව්‍ය තොග සහ පරිභෝගික අයිතම ඇතුලත්වේ. අභාවිත සහ අලුත්වැඩියා කරනු ලැබිය හැකි අයිතම සඳහා වෙන්කිරීම් ලබාදීමෙන් පසුව, පිරිවැයෙන් අඩු අගයක් සඳහා හෝ ශුද්ධ නිශ්කාශන අගය සඳහා භාණ්ඩ ලැයිස්තු තක්සේරු කරනු ලැබේ. ශුද්ධ නිශ්කාශන අගය යනු සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී භාණ්ඩ ලැයිස්තු විකුණනු ලැබිය හැකි මිලගණන් වේ.

3.10 මුදල් සහ මුදල්වලට සමාන දේ

මුදල් සහ මුදල්වලට සමාන දේ යන්න සඳහා අත ඇති මුදල් සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්ය සඳහා මුදල් වශයෙන් හඳුන්වනු ලබන පහසුවෙන් මුදල්බවට පරිවර්තනය කල හැකි කෙටි කාලීනව ඉහල ද්‍රවශීලතා ආයෝජන අර්ථනිරූපණය කල හැකි අතර මුදල් සහ මුදල්වලට සමාන ද්‍රව්‍ය සඳහා අත ඇති මුදල් සහ බැංකුවේ හිඟ අයිරාවල ශුද්ධ අගය, කෙටි කාලීන ණය සහ කෙටි කාලීන ආයෝජන අන්තර්ගතවේ.

3.11 මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශ

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LAKAS) අංක 09 මූල්‍ය ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශවලට අනුව සෘජු ක්‍රමවේදය භාවිත කරමින් මූල්‍ය ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශ සකස් කරනු ලැබ ඇත.

4. සේවා නියුක්ත ප්‍රතිලාභ

(අ) අර්ථනිරූපිත ප්‍රතිලාභ සැලසුම - විශ්‍රාම පාරිතෝෂිකය

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ වූ විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම සඳහා වූ වගකීම යනු සංවිධානයේ සේවානියුක්තිකයන් ආවරණය කරනු ලබන ප්‍රතිලාභ සැලසුමක් වශයෙන් අර්ථනිර්පනය කරනු ලැබිය හැකිවේ. මෙම වගකීම සපුරාලීම සඳහා, සේවයේ පළමු වසරේ සිට ආරම්භව සේවා කාලයේ සෑම එක් එක් සම්පූර්ණ වර්ෂයක් සඳහාම සියලු සේවා නියුක්තිකයන්ගේම මුදල් වර්ෂයේ අවසාන මාසයේ අර්ධ මාසික වැටුපක් මත පදනම්ව ගණනය කරනු ලබන මුදලකට සමානව ශේෂ පත්‍රයේ මුදල් වෙන් කිරීමක් ඉදිරියට ගෙන එනු ලැබේ. වර්ෂය ආරම්භයේදී ඉදිරියට ගෙන එන ලද වෙන් කිරීම සහ වර්ෂයක් අවසානයේ ඉදිරියට ගෙන එන ලද වෙන්කිරීම අතර ඇතිවන වෙනස, ආදායම් ප්‍රකාශයේ සඳහන් කරනු ලැබේ. එසේ හඳුනාගනු ලබන මුදල් වෙනම අයෝජනය කර ඇත.

(ආ) අර්ථනිරූපිත දායකත්ව සැලසුම

සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල මින් අදහස්වේ. අදාල ප්‍රඥප්ති සහ නියෝග වලට අනුව සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල ලබා ගැනීම සඳහා සේවා නියුක්තිකයන් සුදුසුකම් ලබයි.

5. වගකීම් සහ මුදල් වෙන්කිරීම්

ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරනු ලබන සම්පත් බාහිර ගලායෑමක් ඇතිවීම අපේක්ෂාකරනු ලබන නිරාකරණය කිරීමක් වන්නාවූ අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් වශයෙන්වූ වර්තමාන නෛතික/අනුමිත වගකීමක් සහිත අවස්ථාවකදී, ශේෂපත්‍රයේ වගකීම් සහ වෙන්කිරීම් හඳුනාගනු ලැබිය හැකිවේ. ණය දීමනාකරුගේ ඉල්ලීම අනුව ගෙවිය යුතු වගකීම් හෝ ශේෂපත්‍ර දිනයේ සිට එක් අවුරුද්දක් ඇතුලත ගෙවිය යුතු වගකීම්, ශේෂපත්‍රයේ සඳහන් වර්තමාන වගකීම් වශයෙන් සලකනු ලැබේ. ශේෂපත්‍ර දිනයේ සිට එක් අවුරුද්දකින් පසුව ගෙවිය යුතු වගකීම්, ශේෂ පත්‍රයේ සඳහන් තත්කාලීන නොවන වගකීම් ලෙස සලකනු ලැබේ.

(අ) වෙළඳ සහ වෙනත් ගෙවීම්

වෙළඳ සහ වෙනත් ගෙවීම් ස්වකීය පිරිවැය යටතේ ප්‍රකාශ කරනු ලැබේ.

(ආ) විනිමය අනුපාතික නිශ්කාශන සංචිතය

වාණිජ බැංකු වෙත නිකුත් කරන ලද පූර්ව/පශ්චාත් නැව්ගත කිරීම් ණය ඇපකර සම්බන්ධයෙන්වූ විදේශ ව්‍යාවහාර මුදලින් ලැබෙන රක්ෂණ වාරික මුදල්, පොළිය උපචිතවන ඉතුරුම්/ආයෝජනවල තැන්පත් කරනු ලැබ ඇත. දෛනික පදනම මත විනිමය අනුපාතික උච්චාවචනයවේ. ඉතුරුම් අගයන් සහ ආයෝජන අගයන්ද කලින් කල වෙනස්වේ. විදේශ ව්‍යවහාර මුදලින් ගෙවිය යුතු යම් අනාගත හිමිකම් වගකීම් සපුරාලීම සඳහා මෙම ආයෝජන වෙන්කර තබනු ලැබේ. වටිනාකම උච්චාවචනය වීමෙන් ඇතිවන ඉපයීම් හෝ පාඩු ආදායම් ප්‍රකාශය සඳහා ඇතුලත්කර ඇත්නම්, ප්‍රතිඵල මගින් නොමග යවන සුලු මූල්‍ය ප්‍රතිඵල නියෝජනය කරනු ලැබිය හැකිය. ඒ අනුව, ව්‍යවහාර මුදල්වල අගයෙහි සිදුවන උච්චාවචනයවීම් වෙනම සංචිතයක් ලෙස හඳුනාගෙන ඇත. ආයෝජනවල සිදුවන යම් අනාගත වෙනස්වීම් මෙම සංචිතයට එරෙහිව අයකිරීම සහ ගැලපීම් කරනු ලැබේ.

(ඇ) හිමිකම් සඳහා අවිනිශ්චිත වෙනකිරීම්

ගමනාගමන ඇපකර පිරිවැය සඳහාවූ හිමිකම් ගෙවීමේ අනුපාතයේ සඳහන් අපගේ පසුගිය අත්දැකීම් අනුව, ලැබී ඇති රක්ෂණ වාරික වලින් සියයට 30ක පරාසයක් තුල එම පිරිවැය පවතියි.

රක්ෂණ වාරික ලැබීමේ දින සිට වසර 3ක කාලසීමාවක් සඳහා පැතිරී පවතින පරිදි ලැබෙන රක්ෂණ වාරික සඳහා හිමිකම් වගකමක් පවතියි. පසුගිය අද්දැකීම් සමග සලකා බැලීමේදී, ගමනාගමන ණය ඇපකර පිරිවැය සඳහා පිළිවෙලින් 15%, 10% සහ 5% අනුපාතික යටතේ පසුගිය වසර තුනක කාලය සඳහා ලැබී ඇති රක්ෂණ වාරික වලින් සියයට 30 දක්වා වෙන්කිරීමක් අවිනිශ්චිත හිමිකම් සඳහාවූ වෙන්කිරීමක් වශයෙන් සපයනු ලැබ ඇත.

වසර අවසානයේදී පෙන්නුම්කරනු ලබන ශේෂය සඳහා මුහුණ දීම සඳහා සෑම වසරකම මුදල් වෙන්කිරීම් ගලපනු ලැබිය හැකිය.

පහත දැක්වෙන පදනම අනුව වෙනත් නිශ්පාදන සේවා සඳහාවූ මුදල් වෙන්කිරීම් සිදුකරනු ලැබ ඇත.

විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව	15%
ATA කාර්නෙට් පද්ධතිය මත සෘජු ඇපකරය	2%
පූර්ව නැව්ගත කිරීම් ණය ඇපකරය	12%
පශ්චාත් නැව්ගතකිරීම් ණය ඇපකරය	5%

(ඇ) වාර්තාකරන ලද හිමිකම් සඳහා මුදල් වෙන් කිරීම්

මෙම වෙන්කිරීම සිදුකිරීමේදී වාර්තාවූ හිමිකම් හඳුනාගෙන සලකා බලා ඇත. සාධාරණ අවස්ථාවලදී ශේෂ පත්‍ර දිනයේදී පැවති අවස්ථානුගත කරුණු මත හිමිකම් සඳහා විශේෂිත වෙන්කිරීමක් සිදුකර ඇත. හිමිකමක් ලබාදිය හැකි බවට සම්භාවිතාවක් පැවතීම පිළිබඳ සාක්ෂි සහ සහතික කිරීම් පවතියි. හිමිකම් ගෙවීම පසුව සිදුකරන ලද මුදල් වෙන්කිරීම් වලට එරෙහිව හිලව් කරනු ලැබේ. අඛණ්ඩව මුදල් වෙන්කිරීම, හිමිකම් සඳහා වගකීමක් පවතින සසම්භාවී සිදුවීම් පැවතීම මත පදනම් වන්නේය.

(ඉ) අවසන් නොවූ අවදානම් මත උපයානොගත් රක්ෂණ වාරික සඳහා වූ සංචිතය

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුලදී ලිඛිතව ප්‍රකාශ කරන ලද සහ ලැබී ඇත්තාවූ රක්ෂණ වාරික සහ එසේ එකතු කරන ලද රක්ෂණ වාරික මත අවසන් නොවූ අවදානම, රක්ෂණවාරික අදාල වන්නාවූ ඉදිරි මුදල් වර්ෂයේ යම් ආවරණ කාලසීමා කොටසක් සඳහා පැතිර පවතින්නේය. කර්මාන්ත ආචාරධර්ම ප්‍රකාරව වර්තමාන මුදල් වර්ෂය අවසන්වීමෙන් පසුව ආවරණ කාලය සඳහා ප්‍රාමානික රක්ෂණ වාරික වෙන්කර තැබීම මගින් සංචිතයක් නිර්මාණයකර ඇත. සංචිතය තීරණය කිරීමේදී 1/365 ක්‍රමවේදය අදාලකරගෙන ඇත. සංචිතය පිළිගැනීමේදී, අපනයන ගෙවීම් රක්ෂණ ඔප්පු මත වූ එකතු කරන ලද රක්ෂණ වාරික සම්බන්ධයෙන් වන විට, අවසන් නොවූ අවදානම් මත සැබෑ රක්ෂණ ආවරණ කාලසීමාව සලකා බලනු ලැබ ඇත. ආවරණ කාලසීමාව තුල අදාලවන අවදානම්වල සංකීර්ණභාවය, ස්වභාවය සහ ප්‍රමාණය පිළිබඳ සලකා බලමින් සමාලෝචනයට භාජනය වූ වසර තුලදී ඇපකර මත එකතු කරන ලද රක්ෂණ වාරික වලින් 15%ක්, අවසන් නොවූ අවදානම් සඳහා සංචිතයක් වශයෙන් වෙන්කර තබා ඇත.

6. ආදායම

6.1 රක්ෂණ වාරික ආදායම

වසර අවසානය දක්වා භාරදී ඇති සියලුම ප්‍රකාශන පිළිබඳ සැලකිල්ලට ගැනීම මගින් "උපචිතවූ පදනමක් මත" රක්ෂණ වාරික ආදායමෙන් ලැබෙන ආදායම හඳුනාගෙන ඇත. ගිවිසුමේ තනිපුද්ගල නියමන් මත පදනම්ව අවදානම් සහ ප්‍රතිලාභ පැවරීම වෙනස්වනු ඇත. "උපචිතවූ පදනමක් මත" සියලු වියදම් අයිතම ගිණුම්කරණය කරනු ලැබේ. අදාලකරගනු ලැබූ ගිණුම්කරන ප්‍රතිපත්ති, පසුගිය

වර්ෂයේ අදාලකරගනු ලැබූ ප්‍රතිපත්ති සමග අනුකූලවේ.

6.2 වෙනත් මෙහෙයුම් ආදායම්

(අ) දේපළ, යන්ත්‍රාගාර සහ උපාංග විකිණීමෙන් ලැබෙන ලාභ සහ පාඩු

දේපල, යන්ත්‍රාගාර සහ උපාංග අවසන්වීමෙන් හෝ බැහැර කිරීමෙන් ලැබෙන ඉපයීම් හෝ පාඩු, විකිණීම සිදුවන කාලසීමාව තුලදී සිදුවන සහ වෙනත් මෙහෙයුම් ආදායම් වශයෙන් වර්ගීකරණය කරනු ලබන ඉපයීම් හෝ පාඩු වශයෙන් පිළිගනු ලැබේ.

6.3 වියදම් පිළිගැනීම

(අ) ආදායම් වියදම් කිරීම

සියලු හඳුනාගනු ලබන වගකීම් සඳහා සහ දේපළ, යන්ත්‍රාගාර සහ උපාංග ක්ෂයවීම් සඳහා මුදල් වෙන් කිරීමෙන් පසුව ලැබෙන ආදායම් ප්‍රකාශයේ පෙන්නුම් කරනු ලබන සංස්ථාව විසින් උපයනු ලබන ලාභය සංස්ථාවේ ආදායම වන්නේය.

ආදායම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ කාර්ය සඳහා, වියදම් ක්‍රමය ක්‍රියාත්මක කිරීම මගින් ව්‍යවසායේ කාර්යසාධනයේ මූලිකාංග සාධාරණ ලෙස ඉදිරිපත්කරනු ලබන බව අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස වන අතර ඒ අනුව මෙම ඉදිරිපත් කිරීමේ ක්‍රමය අනුගමනය කරනු ලැබේ.

(ආ) ප්‍රාග්ධන වියදම

ව්‍යපාරයක් පවත්වාගෙන යෑම මගින් හෝ ව්‍යාපාරයේ ඉපයීම් ධාරිතාවය වැඩිකිරීමේ කාර්ය සඳහා, ස්ථිර ස්වභාවයේ වත්කම් දීර්ඝ කිරීමේ හෝ ප්‍රවර්ධනය කිරීමේ කාර්ය සඳහා දරනු ලබන වියදම් ප්‍රාග්ධන වියදම් වශයෙන් සලකනු ලැබේ.

දේපල, යන්ත්‍රාගාර සහ උපාංග බැහැර කිරීම මත ආදායම් ස්වභාවයේ ඉපයීම් හෝ පාඩු, ආදායම් ප්‍රකාශයේදී ගිණුම්කරණය කරනු ලැබ ඇත.

6.4 බදු අයකිරීම

ආදායම් බදු වියදම්

වසර සඳහාවූ ආදායම් බදු වියදම් සඳහා ආයෝජන ආදායම මතවූ බදු සංයුක්තවේ. වාර්තාකිරීමේ දිනය මත පනවනු ලබන හෝ පසුව පනවනු ලබන බදු අනුපාතික භාවිත කරමින් හෝ පසුගිය වර්ෂය සම්බන්ධයෙන් ගෙවිය යුතු බදු ගැලපීමෙන් වර්ෂය සඳහා වූ බදු අයකල හැකි ආදායම මත ගෙවිය යුතු අපේක්ෂිත බදු සඳහා වූ ආදායම් ප්‍රකාශයේ ආදායම් බදු ඇතුලත් කරනු ලැබේ. 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ සහ එහි යම් සංශෝධනවල සඳහන් විධිවිධාන ප්‍රකාරව, බදු කාර්ය සඳහා ගලපන ලද වර්ෂය සඳහාවූ ආයෝජන ආදායම මත බදු සඳහාවූ වෙන්කිරීම් පදනම්වේ.

6.5 ණයට ගැනීම් පිරිවැය

ණයට ගැනීම් පිරිවැය යන්නෙන් අදාල වර්ෂයේදී දරනු ලබන යම් වියදමක් අදහස්වේ.

6.6 සංසන්දනාත්මක තොරතුරු

වර්තමාන වර්ෂයේ ඉදිරිපත්කිරීම් තහවුරු කිරීම සඳහා අවශ්‍යවන අවස්ථාවකදී, සංසන්දනාත්මක තොරතුරු ප්‍රතිවර්ගීකරණය කර ඇත.

6.7 බැඳීම් සහ අහඹු සිදුවීම්

අහඹු සිදුවීම් යනු පසුගිය සිදුවීම් මගින් උපචිත වියහැකි යම් සසම්භාවී වත්කම් හෝ වගකීම් අදහස් වන අතර සංස්ථාවේ පාලනයෙන් භාහිරව පවතින ස්ථිර නොවන අනාගත සිදුවීම් සිදුවීම හෝ සිදු නොවීම මත පමණක් එම සිදුවීම් තහවුරු කරනු ලැබිය හැකිවේ.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඊආර්ඊ/ඩී/ඊසීඅයි/01/16/20 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2017 ජූලි 28 දින

සභාපති

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ (14)(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

පිටපත - ලේකම් - මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

මගේ අංකය / எனது இல. / My No. } ටීආර්ඊ/ඩී/ඊසීඅයි/01/16/20 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2017 ජූලි 28 දින

සභාපති

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ (14)(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1978 අංක 15 දරන ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනතේ 20(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපති වෙත 2017 ජුනි 27 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

2.2.1 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය .

	නීති රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571	ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂය තුල 2011 හා 2012 වර්ෂවල සිට පවතින රු.336,500 ක ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ආ)	2000 ජනවාරි 31 දිනැති අංක පීඑෆ්/පීඊ/6 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 24 වගන්තිය හා 2016 අප්‍රේල් 29 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2 වගන්තිය	සංස්ථාවේ සේවකයින් විසින් ගෙවිය යුතු උපයන විට ගෙවීමේ බදු සේවකයන්ගෙන් අයකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කරනු වෙනුවට සංස්ථා අරමුදලින් රු. 879,809 ක් සමාලෝචිත වර්ෂය සඳහා ගෙවා තිබුණි. පසුගිය වර්ෂවල විගණන වාර්තා මගින්ද මෙම කරුණ පෙන්වා දී තිබුණද ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.141,111,575 අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.174,076,131 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 32,964,556 ක පිරිහීමක් නිරීක්ෂණය විය. රක්ෂණ වාරික ආදායම ඇතුළු මෙහෙයුම් ආදායම රු.31,958,052 කින් අඩුවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේදී රු.145,304,938 ක් වූ අතිරික්තය උච්ඡාවචනයන් සහිතව සමාලෝචිත වර්ෂයේදී රු.156,111,575 ක් විය. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමේදී සංස්ථාවේ දායකත්වය 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී සියයට 18 ක වර්ධනයක් හා 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ සියයට 20 ක වර්ධනයක් පෙන්නුම් කළද 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී එය සියයට 12 ක පිරිහීමක් බවට පත්ව තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

1978 අංක 15 දරන ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනතේ 5 වන වගන්තිය ප්‍රකාරව සංස්ථාවේ අරමුණු පහත පරිදි වේ.

(අ) භාණ්ඩ හා සේවා අපනයනකරුවන්ට ලැබිය යුතු ගෙවීම් නොලැබීම හෝ ප්‍රමාදවීම සම්බන්ධයෙන් රක්ෂණ ඔප්පු නිකුත් කිරීම හා නැව්ගත කිරීමට පෙර හෝ නැව්ගත කිරීමෙන් පසු අවශ්‍ය මුදල්දීම පහසු කිරීම පිණිස මූල්‍ය ආයතනවලට ඇප නිකුත් කිරීම.

(ආ) ශ්‍රී ලාංකිකයෙකු විසින් කරන අපනයනවලදී ශ්‍රී ලංකාව තුළදී හෝ ඉන් පිටතදී ඉටු කළයුතු සේවා සඳහා අපනයනකරුවන්ට ඇප නිකුත් කිරීම, මුදලින් ආධාර දීම හා මූල්‍ය ආයතන දෙනු ලබන ණය පහසුකම් සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීම.

(ඇ) විදේශීය රටවල ප්‍රවර්ධනාත්මක කටයුතුවලදී දැරීමට සිදුවිය හැකි පාඩු සම්බන්ධයෙන් ඇප සැලසීම හා අපනයන දියුණු කිරීම සඳහා විදේශවලදී අලෙවි අධ්‍යයන කටයුතු භාරගැනීම, විවිධ අංශ පිළිබඳ සම්මන්ත්‍රණ හා පාඨමාලා පැවැත්වීම සහ අලෙවි කිරීම සම්බන්ධ තොරතුරු රැස්කොට ප්‍රචාරය කිරීම.

(ඈ) රක්ෂණ හා ඇප සම්පාදනය, ජාතික සුභසිද්ධිය සඳහා අවශ්‍යයැයි ආණ්ඩුව විසින් සලකන වගකීම් භාරගැනීම හා ඉටුකිරීම, අපනයන විවිධාංගීකරණය, අපනයන පුළුල් කිරීමට හා අළුත් වෙළඳපළවල් සෙවීමට අපනයනකරුවන්ට උපකාරීවීම හා අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍යයැයි සංස්ථාව සැලකිය හැකි වෙනත් කර්තව්‍ය ඉටුකිරීම.

අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේදී සංස්ථාවේ රක්ෂණ ඔප්පු හා ඇප නිකුත්කිරීම්වලට අදාලව ක්‍රියාකාරී සැලැස්මේ වූ අපේක්ෂිත සංඛ්‍යාව හා තථ්‍ය සංඛ්‍යාව ඉකුත් වර්ෂයේ ප්‍රමාණයන් හා සැසඳීමේදී සියළු රක්ෂණ ඔප්පු නිකුත් කිරීම් 2015 වර්ෂයේදී සියයට 41 සිට සියයට 68 ක පරාසයකින් අඩු වී තිබුණු අතර එය ප්‍රවර්තන වර්ෂයේදී සියයට 53 සිට සියයට 97 ක පරාසයකින් අඩු වී තිබුණි.

(ආ) සංස්ථාව ආරම්භ කර වර්ෂ 29 ක් ගතවී තිබුණද ආයතනික ධාරිතාව වර්ධනය උදෙසා බෙහෙවින් ඉවහල් වන හා ප්‍රධාන මෙහෙයුම් කාර්යයන්ගෙන් එකක් වන රක්ෂණ ඔප්පු හා ඇප වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා අත්පොතක් සකස් කිරීමේ කාර්යය සමාලෝචිත වර්ෂය තුලද ඉටුකිරීමට අපොහොසත් වී තිබුණි.

(ඇ) සංස්ථාවේ අභිවෘද්ධිය පිණිස ජාත්‍යන්තර සම්බන්ධතා වර්ධනය කර ගැනීම සඳහා බෙහෙවින් අවශ්‍ය වන කාර්යයක් ලෙස ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති ECGC-(Export Credit Guarantee Corporation) ණය රක්ෂණ ඔප්පු නිකුත්කිරීමේ කටයුතු සඳහා කාර්ය මණ්ඩලය පුහුණු කිරීමට ජාත්‍යන්තර ප්‍රජාවගේ තාක්ෂණික සහාය ලබා ගැනීම යන්න සමාලෝචිත වර්ෂය තුළදී ඉටුවී නොතිබුණි.

(ඈ) 2016 වර්ෂයේදී අපනයනකරුවන් 120 දෙනෙකුගෙන් මුළු රක්ෂණ වාරික ආදායම ලෙස රු.157,447,332 ක් ලැබී තිබූ අතර එයින් රු.121,908,362 ක් එනම් සියයට 77 ක් ලැබී තිබුණේ අපනයනකරුවන් 21 දෙනෙකුගෙනි. මුළු වාරික ආදායමින් රු.35,205,311 ක් හෙවත් සියයට 22 ක් ලැබී ඇත්තේ එක් අපනයනකරුවකුගෙන් වන අතර එම අපනයනකරුගෙන් පසුගිය වර්ෂයේ ලද රු.62,984,389 ක ආදායම සමාලෝචිත වර්ෂයේදී රු.27,779,078 කින් හෙවත් සියයට 11 කින් අඩුවී තිබුණි. එම නිසා සංස්ථාවේ පැවැත්ම හා ඵලදායීතාවය වර්ධනය කර ගැනීම උදෙසා අපනයනකරුවන් දැනුවත් කිරීමේ කටයුතු ප්‍රචලිත කිරීම හා ක්‍රමවත් කිරීම කාලෝචිත බව නිරීක්ෂණය කෙරේ.

(ඉ) අලෙවිකරණ අංශය මඟින් නිකුත් කරනු ලබන වාර්ෂික වාර්තාව මුද්‍රණය කිරීම සඳහා 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා පමණක් වර්ෂයකට රු.75,000 බැගින් රු.225,000 ක් ප්‍රතිපාදනය කර තිබූ අතර සංස්ථාවේ ගනුදෙනුකරුවන් හා මූල්‍ය ආයතන ඇතුළු දෙස් විදෙස් බාහිර පාර්ශවයන් වෙත ඉදිරිපත් කරනු ලබන මෙම වාර්තාව යාවත්කාලීන වූ තොරතුරු ඇතුලත්ව, භාවිතා කරන්නන් හට ප්‍රයෝජනවත් වන පරිදි හරවත්ව කාලෝචිතව නිකුත් කළ යුතු වුවත් 2016 වර්ෂය දක්වා එම වර්ෂවලට අදාළ වාර්තා මුද්‍රණය කර නොතිබූ අතර 2015 වර්ෂයේ සිට ඒ සඳහා ප්‍රතිපාදනද සලසා නොතිබුණි.

4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විදේශීය භාණ්ඩ ගැණුම්කරුවෙකුගේ තත්ත්ව වාර්තාවල සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමකින් තොරව ප්‍රාග්ධනය EURO 116,000 කින් (රු.මිලියන 17 ක් පමණ) හා සේවකයන් දෙදෙනෙකුගෙන් සමන්විත අළුතින් ආරම්භ කරන තනි පුද්ගල ව්‍යාපාර ආයතනයකට සිදුකරන ලද අපනයන සඳහා අපනයනකරුවන් දෙදෙනෙකුට 2015 අප්‍රේල් 24 දින හා ජූනි 24 දින සිට බලපැවැත්වෙන පරිදි පිළිවෙලින් රු.මිලියන 6 ක් හා රු.මිලියන 6.5 ක් වශයෙන් රු.මිලියන 12.5 ක ණය සීමාවක් අනුමත කර තිබුණි. එක් අපනයනකරුවකුගේ ප්‍රථම අපනයනයට ද අනෙක් අපනයනකරු විසින් කරන ලද ප්‍රථම හා දෙවන අපනයනයන්ටද අදාලව එම විදේශීය ගැණුම්කරු විසින් මුදල් ගෙවීම් පැහැර හැරීම මත එම අපනයනකරුවන් වෙත පිළිවෙලින් රු.3,704,335 ක් හා රු.4,981,984 ක් ලෙස එකතුව රු.8,686,319 ක් වන්දි ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) නව ව්‍යාපාර ආයතනයක් වූ බ්‍රිතාන්‍ය ජාතික ව්‍යාපාරික ආයතනයක භාණ්ඩ ගැණුම්කරුවෙකුගේ ප්‍රාග්ධනය ස්ටර්ලින් පවුම් 1000 (රු.200,000 ක පමණ) ක්වූ අතර මුළු සේවක සංඛ්‍යාව 04 කට සීමාවී තිබුණි. ගැණුම්කරු සම්බන්ධයෙන් වූ තත්ත්ව වාර්තාවල තිබූ අවාසිදායක තත්ත්වයන් කෙරෙහි ප්‍රමාණවත් අවධානය යොමු නොකර රු.15,000,000 ක ණය සීමාවක් ඒ සඳහා ලබාදී තිබුණි. අපනයනකරුගේ පළමු අපනයනයට අදාලව ගැණුම්කරු ගෙවීම් පැහැර හැරීම මත රු.9,504,000 ක් වන්දි ගෙවීමට සංස්ථාවට සිදුවී තිබුණි.

(ඇ) 1988 සැප්තැම්බර් 19 දිනැති අංක 7/88 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත සංස්ථාවේ සේවකයන්ගේ අභිවෘද්ධිය උදෙසා පැවති වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය සංශෝධනය කර තිබූ අතර මේ දක්වා අමාත්‍යාංශයේ අනුමැතියක් ඒ සඳහා ලබාගෙන නොතිබුණි. එමෙන්ම මෙම වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය කෙදිනක සිට කවර ආකාරයක අනුමැතියකින් ආරම්භ කලේද යන්න පිළිබඳ තොරතුරු ලිපිගොනුවේ නොතිබුණි. මෙම ප්‍රතිලාභ ක්‍රමය සඳහා සංස්ථාවේ සේවකයන්ගෙන් මාසිකව වැටුපෙන් රු.30 සිට රු.80 දක්වා මුදලක් පමණක් අයකරන අතර ප්‍රතිලාභ ක්‍රමය යටතේ වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කිරීමේදී නිර්දේශය හා අනුමැතිය සංස්ථාවේ නිලධාරීන් තිදෙනෙක්ගෙන් සමන්විත වූ කමිටුවක් මගින් සිදුකර තිබුණි. මෙම ප්‍රතිලාභ ක්‍රමය යටතේ සමාලෝචිත වර්ෂය තුලදී සංස්ථාවේ සේවකයන් 38 දෙනෙකු සඳහා රු.2,650,729 ක් ගෙවීම් කර තිබුණි.

4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3 වගන්තිය ප්‍රකාරව බඳවා ගැනීමේ පරිපාටිය හා උසස් කිරීමේ ක්‍රමවේදයන් සකස් කර නොතිබීම නිසා අවුරුදු 15 කට අධික සේවා පලපුරුද්දක් ඇති සුදුසුකම් සහිත නිලධාරින්ට පුරප්පාඩු තනතුරු සඳහා උසස්වීම් ලබාදීමේ ක්‍රමවේදයක් නොතිබුණි.

(ආ) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අලෙවි) හා කළමනාකාර (අලෙවි) තනතුරු 2 ක් සඳහා පිළිවෙලින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මෙහෙයුම්) හා විධායක (අලෙවි) යන නිත්‍ය තනතුරු දරන නිලධාරින් දෙදෙනෙකුට 2009 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් වන විටත් වැඩ බැලීමේ පත්වීම් ලබා දී ස්ථිර තනතුරේ ලබන වැටුපට අමතරව වැඩ බැලීමේ දීමනා ලෙස 2016 වර්ෂය සඳහා රු.420,547 ක් ගෙවා තිබූ අතර මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඇ) 2014 ජූනි 06 දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අංක 08 මගින් අනුමැතිය ලබා ගෙන 2014 මැයි 01 දින සිට වැටුප් සංශෝධනයක් කර තිබුණද 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන හා 2016 අප්‍රේල් 25 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ අනුව ආයතනික ප්‍රතිව්‍යුහගතකරණය ජාතික වැටුප් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. තවද 2006 නොවැම්බර් 10 දිනැති අංක 06/2006 (ii) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2009 ජූනි 01 දිනැති අංක 30(1) දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය පරිදි අවම වැටුප් පරිමාණයන් නොසලකා සංස්ථාවේ කළමනාකරණ සහකාර තනතුරු හා සම තත්ත්වයේ තනතුරු සඳහා වැටුප් පරිමාණයක් තීරණය කර ගෙවීම් කර තිබුණි.

5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 වගන්තිය ප්‍රකාරව සංස්ථාව විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5.2 අභ්‍යන්තර විගණනය

2016 දෙසැම්බර් 31 දින තෙක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අභ්‍යන්තර විගණන තනතුරක් අනුමත කරවා ගෙන නොතිබුණ අතර 2012 පෙබරවාරි 10 දින සිට සංස්ථාවේ අභ්‍යන්තර විගණන කටයුතු කරගෙන යාම සඳහා පෞද්ගලික විගණන සමාගමක් පත් කර තිබූ අතර මෙම සමාගමට සමාලෝචිත වර්ෂය තුල රු. 281,194 ක් ගෙවා තිබුණි.

5.3 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත සහ තත්‍ය ආදායම් හා වියදම් අතර සියයට 27 ක සිට සියයට 152 ක් දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

	පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ)	විදේශීය ගැණුම්කරුවන් ඇගයීමේ ක්‍රියාවලිය	තත්ත්ව වාර්තා ඇගයීමේදී හා ණය සීමා තීරණය කිරීමේදී ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබීම.
(ආ)	සේවක පරිපාලනය	සේවකයන් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ කටයුතු විධිමත් නොවීම.
(ඇ)	මෙහෙයුම් පාලනය	ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක කරා ළඟා නොවීම.

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති